## සිව් වැනි කොටස

## මහ බැංකුවේ හා ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ

## 1985 ප්‍රධාන නීති අනපනත්

පිටුව


1. 1985 අංක 1 දරණ සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනත ... I

2. 1985 අංක 3 දරණ ලියාපදිංචි කල ස්කන්ධ හා සුරැකුම් පත් (සංශෝධන) පනත ... ... ... ... VI

3. 1985 අංක 15 දරණ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත ... VI

4. 1985 අංක 16 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත ... XXI

5. 1985 අංක 41 දරණ මුදල් බදු (සංශෝධන) පනත ... ... XXXVII

6. 1985 අංක 47 දරණ විසර්ජන පනත ... ... ... XLI

7. 1985 අංක 52 දරණ මුදල් නීති (සංශෝධන) පනත ... ... XLIV

8. 1985 අංක 53 දරණ මුදල් බදු (ඉවත් කිරීමේ) පනත ... ... L

9. 1985 අංක 54 දරණ පිරිවැටුම් බදු (සංශෝධන) පනත ... LI

10. 1985 අංක 55 දරණ විසර්ජන (සංශෝධන) පනත ... ... LI

11. 1985 අංක 56 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත ... LII

# 1985 අංක 1 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 ජනවාරි මස 09 වන දින.]

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1985 අංක 1 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය '' යනුවෙන් හඳුන්වනු ලබන) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ආආ) ස්වකීය සේවායෝජකයන් විසින් අරමුදලට ගෙවනු ලැබිය යුතු දයක මුදල් එසේ ගෙවිය යුතු දිනයේ දී ගෙවීම ඔවුන් පැහැර හැරීම නිසා පාඩුවන සාමාජිකයන් අතර 16 වන වගන්තියේ විධිවිධාන යටතේ අධිභාරයක් ලෙස ලබාගත් මුදල්වලින් බෙදනු ලැබිය යුතු අධිභාරයේ ප්‍රමාණය අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය ;'' ; සහ

(2) එහි (ඔ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

'' (ඔ) අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන්, මේ පනත යටතේ මණ්ඩලය සහ කොමසාරිස්වරයා සතු කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය සහ කොමසාරිස්වරයා විසින් දරනු ලැබූ වියදම් අඩු කළ යුතු ය ;''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

''පනත ක්‍රියාත්මක කිරීමේදී දරන ලද වියදම්.

7අ. මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයා සහ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබූ වියදම් අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන් අයකර ගත යුතු ය.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තියේ ඇති '' එසේ වුව ද '' යන වචන වලින් පටන් ගන්නා අතුරු වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ ;

(2) එහි (2) වන උපවගන්තියේ ඇති ''ඊළඟ මාසයෙහි අවසාන දිනයට පෙර අරමුදලට ගෙවීමට'' යන වචන වෙනුවට ''ඊළඟ මාසයෙහි අවසාන දින හෝ එදිනට පෙර අරමුදලට ගෙවීමට'' යන වචන ආදේශ කිරීමෙන්.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඉ) ඒ සාමාජිකයා ආරක්ෂිත සේවා නියුක්තියක සේවයේ යෙදී සිටීම අවසන් වී විශ්‍රාම වැටුප් සහිත පහත සඳහන් සේවයක නියුක්ත වීමෙන් පසු—

(i) රජයේ සේවයේ ;

(ii) 1974 අංක 16 දරන පලාත් පාලන සේවා පනතින් පිහිටුවනු ලැබූ පලාත් පාලන සේවාවෙහි ;

(iii) 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 47 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් සේවයෙහි ;

(iv) පලාත් පාලන සේවයෙහි සාමාජිකයකු ලෙස හැර යම් පලාත් පාලන ආයතනයක සේවයෙහි.".

(3) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සාමාජිකයකු විසින් ඉදිරිපත් කරනු ලැබූ වෛද්‍ය සහතිකයක සත්‍යතාවය පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාට සැක කිරීමට හේතුවක් ඇති වූ අවස්ථාවක දී, කොමසාරිස්වරයා විසින් අදාළ සාමාජිකයා නිසිපරිදි සංස්ථාපිත වෛද්‍ය මණ්ඩලයක් හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු විසින් නැවත පරීක්ෂා කිරීම සඳහා යොමු කළ හැකි අතර එසේ නැවත පරීක්ෂා කරනු ලැබීමේ දී මුලින් ඉදිරිපත් කරනු ලැබූ වෛද්‍ය සහතිකයෙහි සඳහන් යම් වැදගත් කරුණක් අසත්‍ය බවට සොයා ගනු ලැබුවහොත්, කොමසාරිස්වරයා විසින් ඒ වෛද්‍ය සහතිකය ප්‍රතික්ෂේප කළ යුතු අතර ඒ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයා විසින් අනාගතයේ දී ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික පිළි නොගැනීමට කොමසාරිස්වරයාට හිමිකම තිබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනයකරනු ලැබේ :—

(1) පහත දැක්වෙන අලුත් උපවගන්ති එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම එකතු කිරීමෙන් :—

"(2අ) සේවායෝජකයන් හෝ යම් අනුමත අර්ථසාධක අරමුදලක හෝ අනුමත දායක විය යුතු විශ්‍රාම වැටුප් ක්‍රමයක පරිපාලකවරයන් හෝ විසින් යම් මාසයක් සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දින හෝ එදිනට පෙර එම අරමුදලට හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවනු නොලැබ ඒ දායක මුදල් ගෙවීම පැහැර හැරීම සිදු වූයේ තමාට පාලනය කිරීමට නොහැකි හේතු කරන කොට

ගෙන බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන සේ සඳහා දීමට එම සේවායෝජකයාට හෝ පරිපාලක වරයාට නොහැකි නම්, ගෙවිය යුතු දයක මුදල් ප්‍රමාණයට අමතරව පහත දැක්වෙන ආකාරයට එම මුදල් ප්‍රමාණය මත ගණන් බලනු ලැබූ අධිභාරයක් ද ඒ අරමුදලට හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවීමට ඔහු යටත් විය යුතු ය :—

(අ) දින දහයක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දයක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දයක මුදල්වලින් සියයට පහක අධිභාරයක් ;

(ආ) දින දහයක් ඉක්ම වූ එක් මාසයක් නොඉක්ම වූ කාල සීමාවක් සඳහා දයක මුදල් හිඟතබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දයක මුදල්වලින් සියයට පහලොවක අධිභාරයක් ;

(ඇ) එක් මාසයක් ඉක්ම වූ එහෙත් මාස තුනක් නො ඉක්ම වූ කාල සීමාවක් සඳහා දයක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දයක මුදල් වලින් සියයට විස්සක අධිභාරයක් ;

(ඈ) මාස තුනක් ඉක්ම වූ එහෙත් මාස හයක් නො ඉක්ම වූ කාල සීමාවක් සඳහා දයක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දයක මුදල්වලින් සියයට තිහක අධිභාරයක් ;

(ඉ) මාස හයක් ඉක්ම වූ එහෙත් මාස දොළහක් නොඉක්ම වූ කාල සීමාවක් සඳහා දයක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී, ගෙවීමට ඇති දයක මුදල් වලින් සියයට හතළිහක අධිභාරයක් ; සහ

(ඊ) මාස දොළහක් ඉක්ම වූ කාල සීමාවක් සඳහා දයක මුදල් හිඟ තබා ඇති අවස්ථාවක දී ගෙවීමට ඇති දයක මුදල්වලින් සියයට පනහක අධිභාරයක්.

(2ආ) අධිභාර ලෙස ලැබ යම් අනුමත අර්ථසාධක අරමුදලක හෝ අනුමත දයක විය යුතු විශ්‍රාම වැටුප් ක්‍රමයක හෝ අරමුදලට ගෙවනු ලැබූ මුදල්, අවස්ථාවෝචිත පරිදි, එම අරමුදලේ හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආදායමෙහි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එම අරමුදලේ හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකයන් අතර බෙදනු ලැබිය යුතු ය." සහ

(2) එම වගන්තියේ (11) වන උපවගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (12) අවස්ථාවෝචිත පරිදි සේවා යෝජකයකු හෝ පරිපාලකයකු අහ අනුමත අර්ථසාධක අරමුදලක හෝ අනුමත දයක විය යුතු විශ්‍රාම වැටුප් ක්‍රමයක යම් සාමාජිකයකු අතර ආරවුලක් ඇති බව කොමසාරිස්වරයාට දැනුම් දී ඇති අවස්ථාවක, ඒ ආරවුල සමථයකට පත් කිරීම සඳහා අවස්ථානුකූලව සුදුසු යයි කොමසාරිස්වරයා සලකන විධාන ඔහු විසින් නිකුත් කළ යුතු ය. මේ උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ යම් විධාන ආරවුලට සම්බන්ධ පාර්ශවයන් කෙරෙහි අනුගම්‍ය වේ."

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) එම වගන්තියේ (ආ) ඡේදයෙහි ඇති ''අසත්‍ය හෝ සාවද්‍ය; හෝ'', යන වචන වෙනුවට ''අසත්‍ය හෝ සාවද්‍ය ;''; යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) එම වගන්තියේ (ඇ) ඡේදයේ ඇති ''32 වන වගන්තිය යටතේ ඇති බලතල'', යන වචන වෙනුවට '' 32 වන වගන්තිය යටතේ ඇති බලතල ; හෝ '' යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) එම වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුලත් කිරීමෙන් :—

'' (ඈ) 27 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයක් උල්ලංඝනය කරන,''.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති ''ගෙවීම පැහැර හරින සේවායෝජකයා පදිංචිව සිටින හෝ ඒ සේවායෝජකයාට අයිති යම් චංචල හෝ නිශ්චල දේපලක් පිහිටා ඇති යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති'' යන වචන වෙනුවට '' ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්තේ අරමුදලේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා හෝ සාමාජිකයන්, ගෙවීම පැහැර හැර ඇති සේවායෝජකයා විසින් සේවයේ නියුක්ත කර ඇති හෝ සේවයේ නියුක්ත කරනු ලැබ ඇති දිස්ත්‍රික්කයේ අධිකරණ බලය ඇති.'' යන වචන ආදේශ කිරීමෙන්,'';

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ඇති ''ඒ ස්ථානය පිහිටා ඇති කොට්ඨාසයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත'' යන වචන වෙනුවට '' ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්තේ අරමුදලේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයාගේ හෝ සාමාජිකයන්ගේ සේවා ස්ථානය පිහිටි කොට්ඨාසයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත'' යන වචන ආදේශ කිරීමෙන්.''.

9. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 47 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ''ආරක්ෂිත සේවා නියුක්තිය'' යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'' නිසි පරිදි සංස්ථාපිත වෛද්‍ය මණ්ඩලය'' යන්නෙන් සාධාරණ සැකයට හේතුවන වෛද්‍ය සහතික ඉදිරිපත් කර ඇති තැනැත්තන් පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලැබූ වෛද්‍ය මණ්ඩලයක් අදහස් වේ;'' ;

(2) ''ඉපයීම'' යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' '' ඉපයීම '' යන්නෙන්—

(අ) පඩි, වැටුප් හෝ ගාස්තු ;

(ආ) ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව සහ වෙනත් සමාන දීමනා ;

(ඇ) නිවාඩු දින සම්බන්ධයෙන් කරනු ලබන ගෙවීම ;

(ඈ) නියමිත සේවා නියුක්තිවල සේවා නියුක්තයන්ට සේවා යෝජකයා විසින් සපයනු ලැබූ පිසූ හෝ නොපිසූ ආහාරවල මුදල් වටිනාකම සහ එසේ සපයනු ලැබූ ආහාර පිළියෙල කිරීමේ දී භාවිතා කරනු ලැබූ හෝ එම ආහාරවල අඩංගු හෝ යම් ද්‍රව්‍යයක මුදල් වටිනාකම ; සේවා යෝජකයා විසින් තක්සේරු කළ යුතු එම වටිනාකම කොමසාරිස්වරයාවෙත කරනු ලබන අභියාචනයකට යටත් විය යුතු අතර එම අභියාචනය පිළිබඳව කොමසාරිස්වරයා ගේ තීරණය අවසානාත්මක විය යුතු ය ;

(ඉ) ආහාර දීමනාව ; සහ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් අන්දමේ පාරිශ්‍රමික

අදහස් වේ ; ' ;

(3) ''සේවා නියුක්තයා'' යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' '' සේවා නියුක්තයා '' යන්නෙන් සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම ප්‍රකාශිත හෝ ගම්‍යමාන නැතහොත් වාචික හෝ ලිඛිත වූ ද ඒ ගිවිසුම සේවය සම්බන්ධයෙන් හෝ ආධුනිකත්වය සම්බන්ධයෙන් හෝ ගිවිසුමක් වුවද නැතහොත් ශ්‍රමය සම්බන්ධයෙන් වූ යම් වැඩක් පෞද්ගලිකවම ක්‍රියාත්මක කිරීම පිණිස වූ ගිවිසුමක් වුවද කවර වූ යම් තත්ත්වයකින් සේවා යෝජකයකු සමග ගිවිසුමකට ඇතුලු වූ හෝ ගිවිසුමක් යටතේ වැඩ කරන යම් තැනැත්තකු අදහස් වන අතර යම් තැනැත්තකු යම් විශේෂ අවස්ථාවකදී සේවයෙහි නියුක්ත වුවද සේවයෙහි නියුක්ත නොවුවද එවැනි යම් ගිවිසුමක් යටතේ සාමාන්‍යයෙන් සේවයෙහි නියුක්ත ඒ තැනැත්තා ද ඇතුලත් වේ ; ' ;

(4) '' සේවා යෝජක '' යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' '' සේවා යෝජක '' යන්නෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තකු හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලබන යම් තැනැත්තකු අදහස් වන අතර සේවා යෝජක මණ්ඩලයක්, (ඒ මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක්, සමාගමක්, සංස්ථාවක් හෝ වෘත්තීය සංගමයක්) සහ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තකු ඊට ඇතුළත් වේ. තවද නීත්‍යානුකූල උරුමක්කරු, නීතිය අනුව අනුප්‍රාප්තිකයා, පොල්මෘකරු, හෝ අද්මිනිස්ත්‍රාසිකරු සහ සමාගමක ඇවරකරු ඊට ඇතුළත් වේ. තවද සංස්ථාගත මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ මණ්ඩලයේ සභාපතිවරයා හෝ ලේකම්වරයා ද හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට එහි කළමනාකාර හවුල්කරු හෝ කළමනාකරු ද ඇතුළත් වේ ; '.

## 1985 අංක 3 දරන ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 ජනවාරි මස 09 වන දින.]

**ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1985 අංක 3 දරන ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 30 වන වගන්තියට ඉක්බිතිව ම, 30අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු පහත දක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''ඒකාබද්ධ ආයෝජන අරමුදලේ ආයෝජන වලින් ලැබෙන ආදායම සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය.

30අ. එසේ වුවද යම් නිදහන් අරමුදලක මුදල් (මෙහි මින්මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඒකාබද්ධ ආයෝජන අරමුදල මගින් ආයෝජනය කරනු ලැබූ අවස්ථාවක, ඒ ආයෝජනය මත—

(අ) පරිණත වන්නා වූ ණය නිදහස් කිරීමෙහිලා යම් නිදහන් අරමුදලක තැන්පතු පියවීමේ දී සියලු ගෙවීම් අරමුදලින් ගෙවනු ලැබීමෙන් පසු, අරමුදලට දැනටමත් ලැබී ඇති හෝ උපචිත වන්නා වූ හෝ වුව ද, 1984 ජනවාරි මස 1 වන දින සිට 1984 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාල සීමාව තුළ අතිරික්තය සමන්විත වන්නා වූ ; සහ

(ආ) 1985 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව අරමුදලට උපචිත වන්නා වූ

සියලු ලාභාංශ, පොලී, ප්‍රසාද දීමනා සහ වෙනත් ලාභ ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, ''ඒකාබද්ධ ආයෝජන අරමුදල'' යන්නෙන්, යම් නිදහන් අරමුදලක මුදල් ආයෝජනය සඳහා තැන්පත් කරනු ලබන්නා වූ මුදල් නීති පනතේ 106 (2) වන වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවනු ලැබුවා වූ අරමුදල අදහස් වේ.''.

## 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත

[සහතිකය සටහන් කළේ 1985 අප්‍රේල් මස 10 වන දින.]

**ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකර්මය, ගෘහ කර්මාන්ත සහ සුළු පරිමාණයේ කර්මාන්ත, ධීවර කර්මාන්තය, වාණිජ්‍යය සහ වෙනත් සංවර්ධන කටයුතු සංවර්ධනය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීමෙන් ග්‍රාමීය ආර්ථිකය සංවර්ධන කිරීමේ අරමුණ ඇතිව, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවීමට මහ බැංකුවේ මුදල් මණ්ඩලයට හැකිවනු පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I වන කොටස

### ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවීම

**2.** (1) ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකර්මය, ගෘහ කර්මාන්ත සහ සුළු පරිමාණයේ කර්මාන්ත, ධීවර කර්මාන්තය, වාණිජ්‍යය සහ වෙනත් සංවර්ධන කටයුතු සංවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීමෙන් ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා (මෙහි මින් මතු '' බැංකුව '' යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු එකක් හෝ ඊට වැඩි ගණනක් පිහිටුවීම අවශ්‍ය යයි (මෙහි මින් මතු '' මූල්‍ය මණ්ඩලය '' යනුවෙන් සඳහන් කරනු ලබන) මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය අදහස් කරන විටක දී, මූල්‍ය මණ්ඩලය විසින් (මෙහි මින් මතු '' සංස්ථාගත කිරීමේ නියමය '' යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් —

(අ) ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකර්මය, ගෘහ කර්මාන්තය සහ සුළු පරිමාණයේ කර්මාන්ත, ධීවර කර්මාන්තය, වාණිජ්‍යය සහ වෙනත් සංවර්ධන කටයුතු සංවර්ධනය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීමෙන් ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා බැංකුව පිහිටුවිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය හැකිය ;

(ආ) බැංකුවට සංස්ථාගත නාමයක් පවරා දෙනු ලැබිය හැකිය ;

(ඇ) බැංකුව කටයුතු කළ යුත්තේ කවර ප්‍රදේශයක් තුළ දැයි ප්‍රකාශ කරනු ලැබිය හැකිය ;

(ඈ) බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කවරේදැයි ප්‍රකාශ කරනු ලැබිය හැකිය ;

(ඉ) බැංකුව විසින් ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ යුතු දිනය කවරේදැයි නියම කරනු ලැබිය හැකිය ;

(ඊ) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පළමුවන සාමාජිකයන් වශයෙන් 8 වන වගන්තිය යටතේ පත් කරනු ලබන තැනැත්තන්ගේ නම් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) සෑම බැංකුවක් ම, සංස්ථාගත කිරීමේ නියමය මගින් ඊට පවරනු ලැබූ නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් ඇත්තේය. තවද බැංකුව විසින් පොදු මුද්‍රාවක් තබාගනු ලැබිය හැකි අතර සංස්ථාපිත නාමයෙන් එය විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

**3.** (1) බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය, සංස්ථාගත කිරීමේ නියමයෙහි නිශ්චිතවම සඳහන් ස්ථානය විය යුතු ය.

(2) අවශ්‍ය යයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකනු ලබන අවස්ථාවලදී, සංස්ථාගත කිරීමේ නියමයෙහි නිශ්චිතව ම සඳහන් ප්‍රදේශය තුළ කවර හෝ ස්ථානයක බැංකුවේ ශාඛා සහ නියෝජ්‍යායතන බැංකුව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

**4.** සංස්ථාගත කිරීමේ නියමයෙහි නිශ්චිතවම සඳහන් ප්‍රදේශය තුළ කෘෂිකාර්මික, කාර්මික, ධීවර, වාණිජ්‍යය සහ වෙනත් සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම බැංකුවේ පරමාර්ථ විය යුතු ය.

**5.** යම් විදේශ විනිමය කටයුතු හැර අනෙකුත් බැංකු කටයුතු බැංකුව විසින් කරගෙන යෑම සහ පවත්වාගෙන යෑම කළ හැකි ය.

**6.** බැංකුවේ පරමාර්ථ ඉටු කිරීමේදී බැංකුව විසින් මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය :—

(අ) තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ විශේෂයෙන්ම ගොවියන්ට සහ කෘෂිකාර්මික කම්කරුවන්ට ද, සමුපකාර සමිතිවලට සහ අලෙවි හා පිරිසැකසුම් කටයුතු පිළිබඳ සමිතිවලට ද කෘෂිකාර්මික කටයුතු සඳහා හෝ කෘෂිකර්මයට අදාළ වෙනත් කාර්යයන් සඳහා කෙටිකාලීන, මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන සහ වෙනත් අන්දමේ ණය ප්‍රදානය කිරීම ;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව සුළු පරිමාණයේ ක්‍රියාකාරකම් වශයෙන් සලකනු ලබන ගෘහ කර්මාන්තවල, ධීවර කර්මාන්තයෙහි, වාණිජ්‍යය කටයුතු හෝ වෙනත් වර්ගවල සංවර්ධන කටයුතුවල නිරත වී සිටින ශිල්පීන්ට සහ වෙනත් තැනැත්තන්ට තනිතනිව හෝ කණ්ඩායම් වශයෙන් කෙටි කාලීන, මධ්‍යකාලීන, දීර්ඝ කාලීන සහ වෙනත් අන්දමේ ණය ප්‍රදානය කිරීම ;

(ඇ) ජංගම, තැන්පතු, ඉතිරි කිරීමේ සහ වෙනත් අන්දමේ ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යෑම සහ කළමනාකරණය කිරීම ;

(ඈ) විනිමය බිල්පත්‍ර, පොරොන්දු නෝට්ටු, අණකර, කොටස්, සෘණකර, සහතික පත්, කොටස් පත් සහ වෙනත් සාධන පත්‍ර සහ සුරැකුම් පත් වට්ටම් කිරීම, මිලට ගැනීම, විකිණීම සහ ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම ;

(ඉ) ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කිරීම, තැන්පතු සඳහා හෝ ආරක්ෂා භාරයේ තැබීමට හෝ මුදල්, සුරැකුම් පත් සහ වටිනා භාණ්ඩ භාර ගැනීම ;

(ඊ) මුදල් සහ සුරැකුම් පත් රැස් කිරීම සහ ප්‍රේෂණය කිරීම ;

(උ) නිශ්චල මෙන්ම චංචල දේපළ කළමනාකරණය කිරීම සහ බැංකුකරුවන් විසින් සාමාන්‍යයෙන් කරනු ලබන සියලු වර්ගවලට අයත් අනුයෝජිත ව්‍යාපාර කටයුතු කිරීම ;

(ඌ) සුදුසු යයි බැංකුව විසින් අදහස් කරනු ලබන ආකාරයකින් මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ස්වකීය රැස් කළ හැකි ප්‍රාග්ධනය ඇතුළුව දනට ඇත්තා වූ හෝ ඉදිරියේ දී ඇති විය හැකි වූ බැංකුවේ සම්පූර්ණ දේපළ හෝ වත්කම් හෝ ඉන් යම් කොටසක් මත උකසක්, වැය භාරයක් හෝ කැප අයිතියක් මගින් ණයට ලබා ගන්නා ලද හෝ ලබා ගන්නා ලද හෝ අය විය යුතු මුදල් කිසිවක් නොපමාව ආපසු ගෙවීම සුරක්ෂිත කිරීම ; තවද බැංකුව විසින් භාර ගනු ලබන යම් බැඳීමක් හෝ වගකීමක් බැංකුව විසින් ඉටුකිරීම සම්බන්ධයෙන් ඒ සමාන උකසක් වැය භාරයක් හෝ කැප අයිතියක් මගින් සුරක්ෂිත කිරීම සහ සහතික කිරීම ;

(එ) සුරැකුම් පත් සහ දේපළ මත මුදල් ණයට දීම සහ අත්තිකාරම් දීම සහ ඇප ඇතිව හෝ නොමැතිව අවස්ථානුකූල යයි බැංකුව විසින් සලකනු ලබන නියමයන් මත තැනැත්තන්ට, ව්‍යාපාර ආයතනවලට හෝ සමාගම්වලට ණය දීම ;

(ඒ) කෘෂිකාර්මික නිෂ්පාදන සහ කාර්මික භාණ්ඩ අලෙවි කිරීම සහ සකස් කිරීම සඳහා සහාය වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ඔ) මාලු අලෙවිය සහ ධීවර නිෂ්පාදන සැකසීම් ප්‍රවර්ධනය කිරීමෙහිලා සහායවීම ;

(ඕ) මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කොන්දේසිවලට යටත්ව බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය පවත්වා ගෙන යාම ;

(ක) යම් චංචල හෝ නිශ්චල දේපළ හෝ කෘෂිකාර්මික, කාර්මික, ධීවර, වාණිජ හෝ වෙනත් ව්‍යවසායක් අත්කර ගැනීම හෝ මිලට ගැනීම සහ ඒ දේපළ හෝ ව්‍යවසාය කළමනාකරණය කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා සංවිධානය කිරීම සහ ඒ දේපළ හෝ ව්‍යවසාය විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ග) බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස නියමු ව්‍යාපෘති ඇතුළුව සුළු පරිමාණයේ ව්‍යාපෘති වන්නාවූ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති භාර ගැනීම ;

(ච) පරිසර විද්‍යාත්මක ප්‍රතිසංස්කරණය කිරීමේ කොටසක් වශයෙන් ගස් සිටුවීම වැනි කටයුතුවලට දිරි ගැන්වීම සැලසීමෙන් ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීම සහ ගම් වැඩි දියුණු කිරීම ප්‍රවර්ධනය කිරීමෙහි ලා සහාය වීම සහ බැංකුවේ අරමුණු ඉටු කෙරෙන උපදේශාත්මක සහාය පොදු වශයෙන් සැලසීම ;

(ජ) කෘෂිකාර්මික, කාර්මික, ධීවර සහ වාණිජ කටයුතු සඳහා අවශ්‍ය ගුදම්, බඩු රඳවන ස්ථාන, ගබඩා සහ ගොඩනැගිලි ග්‍රාමීය ප්‍රදේශවල ඉදිකිරීම සම්බන්ධයෙන් නිරතවීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ට) යම් බැංකු ආයතනයක් විසින් හෝ සමුපකාර සමිතියක් විසින් හෝ මුදල් යොදවනු ලබන නැතහොත් යම් බැංකු ආයතනයක් හෝ සමුපකාර සමිතියක් විසින් හෝ කරගෙන යනු ලබන යම් ව්‍යවසායක් හෝ ව්‍යාපෘතියක් අත්කර ගැනීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශයන්ට යටත්ව ඒ බැංකු ආයතනය හෝ සමුපකාර සමිතිය සමඟ යම් ගිවිසුමකට ඇතුළත් වීම ;

(ඩ) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි, යම් වාණිජ බැංකුවක හෝ සමුපකාර සමිතියක තැන්පතු ගිණුම් විවෘත කිරීම හෝ මූල්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාවෙන් පිටත යම් බැංකුවක හෝ මුදල් ආයතනයක තැන්පතු ගිණුම් විවෘත කිරීම ;

(ණ) යන්ත්‍ර, උපකරණ සහ වෙනත් බඩු සහ ග්‍රාමීය ප්‍රදේශවල ගුදම්, බඩු රඳවන ස්ථාන, ගබඩා සහ ගොඩනැගිලි බදුදීම, කුලියට දීම, සින්නක්කර විකිණීම හෝ කුලී සින්නක්කර පදනමක් මත විකිණීම ;

(ත) බැංකුවක ණයට දීමේ කටයුතු සම්බන්ධයෙන් අධෝ ව්‍යුහ සහාය සැලසීම පිණිස සමුපකාර අලෙවි හා සැකසුම් සමිතිවල සහ වෙනත් වර්ගවලට අයත් සමුපකාර සමිතිවල කොටස් මිලට ගැනීම හෝ අත්කර ගැනීම ;

(ද) යම් නිශ්චල හෝ චංචල දේපළ කවර වූ ආකාරයකින් අත්කර ගැනීම හා දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(න) බැංකුවේ වැඩ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම ;

(ප) බැංකුව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම සහ සුභසාධන හා විනෝද පහසුකම් සහ ඉඳුම් හිටුම් පහසුකම් සැලසීම ;

(බ) බැංකුවේ කාර්ය මණ්ඩලය සේවයෙන් පහ කිරීම සහ කාර්ය මණ්ඩලය විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ම) කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ය) කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් සහ කොන්දේසි තීරණය කිරීම ;

(අඅ) බැංකුවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය, ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත සියලු ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒවා ඉටු කිරීම ;

(ආආ) නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය හා ඔවුන්ගේ හැසිරීම සහ ඔවුන්ට නිවාඩුදීම ඇතුලුව ස්වකීය නිලධරයන් සහ සේවකයන් සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඇඇ) බැංකුවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඈඈ) බැංකුවේ ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාම පහසු කිරීමට මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය සියලු දේ කිරීම.

## II වන කොටස

### බැංකුවේ කළමනාකරණය

**7.** (1) බැංකුවේ කටයුතු හා ව්‍යාපාරය කළමනාකරණය සහ පරිපාලනය (මෙහි මින් මතු " මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

(2) මණ්ඩලය විසින් මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ බැංකුව සතු සියලු බලතල ක්‍රියාත්මක කළ හැකි අතර මේ පනත යටතේ බැංකුව විසින් කළ හැකි සියලු ක්‍රියා සහ දේවල් ද කළ හැකි ය.

(3) මණ්ඩලය විසින්, ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ස්වාවර ව්‍යාපාරික මූලධර්ම මත පිහිටා ක්‍රියා කළ යුතු අතර ග්‍රාමීය සංවර්ධනයේ අවශ්‍යතා පිළිබඳව නිසි සැලකිල්ල යෙදවිය යුතු යි.

**8.** (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතුව මූල්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙක් ;

(ආ) (3) වන උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරගනු ලැබූ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්.

(2) මූල්‍ය මණ්ඩලය විසින්, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂවරයන් අතුරෙන්, සභාපතිවරයකු අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පත් කළ යුතු ය.

(3) මූල්‍ය මණ්ඩලය විසින්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් අධ්‍යක්ෂවරයන් දෙදෙනා, ආරම්භක වශයෙන් අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා හෝ 20 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි බැංකුවේ කොටස් පවරන තෙක් හෝ යන මෙයින් පසුව එළඹෙන දිනය දක්වා ධුර දැරීම පිණිස, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, පත් කරනු ලැබිය යුතු අතර, ඉන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව හැර අනෙකුත් කොටස් හිමියන් නියෝජනය කිරීම සඳහා, මූල්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි සුදුසුකම් ඇති තැනැත්තන් අතුරෙන් සහ එසේම නිශ්චය කරනු ලැබිය හැකි ක්‍රියා පටිපාටියකට අනුකූලව, අධ්‍යක්ෂවරුන් දෙදෙනකු බැංකුවේ මහා සභාව විසින් තෝරා පත් කර ගත යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ආරම්භක අවස්ථාවේ දී පත් කරන ලද අධ්‍යක්ෂවරයන් හැර, අධ්‍යක්ෂවරයකුගේ ධුර කාලය, (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අවුරුදු පහක් විය යුතු ය.

(5) යම් අධ්‍යක්ෂවරයකු, ස්වකීය ධුර කාලය ඉකුත්වීමට පෙරාතුව ධුරය හැර ගිය අවස්ථාවක, මූල්‍ය මණ්ඩලය විසින්, අවස්ථාවෝචිත පරිදි අමාත්‍යවරයාගේ හෝ බැංකුවේ මහා සභාවේ හෝ එකඟත්වය ඇතිව, ඒ අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිවී ඇති කාලය තුළ ධුරය දැරීම සඳහා අනුප්‍රාප්තිකයකු පත්කිරීම හෝ තෝරා පත් කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

(6) මූල්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කවර හෝ අධ්‍යක්ෂවරයකු, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මූල්‍ය මණ්ඩලය විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) කාලය ඉකුත්වීමෙන් ධුරය හැර යන අධ්‍යක්ෂවරයකු නැවත පත් කිරීම හෝ නැවත තෝරා පත්කර ගැනීම කළ හැකි ය.

(8) (3) වන උපවගන්තිය යටතේ බැංකුවේ මහා සභාව විසින් තෝරා පත්කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයකුට විරුද්ධව බැංකුවේ මහා සභාවේ රැස්වීමකදී විශ්වාසභංග යෝජනාවක්, ඒ රැස්වීමට පැමිණ ඒ යෝජනාව සම්බන්ධයෙන් ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් සම්මත කරනු ලැබුවහොත් ඒ අධ්‍යක්ෂවරයා ධුරය අත්හළ යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා අනුප්‍රාප්තිකයකු තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(9) මූල්‍ය මණ්ඩලය අමතා ලිපියක් යැවීමෙන් කවර හෝ අධ්‍යක්ෂවරයකු විසින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(10) යම් අධ්‍යක්ෂවරයකු, රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක මණ්ඩලයේ රැස්වීම්වල දී ඔහුගේ විකල්ප අධ්‍යක්ෂවරයා වශයෙන්

ක්‍රියා කිරීම සඳහා යෝග්‍ය තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයාගේ හෝ බැංකුවේ මහා සභාවේ එකඟත්වය ඇතිව, මූල්‍ය මණ්ඩලය විසින් පත් කිරීම හෝ තෝරා පත්කිරීම කළ හැකි අතර ඒ තැනැත්තාට මණ්ඩලයේ රැස්වීම්වල දී ඡන්දය දීමට අයිතිවාසිකම තිබිය යුතු ය.

**9.** යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වේ නම් හෝ දිස්ත්‍රික් සංවර්ධන සභාවක නැතහොත් යම් පළාත් පාලන ආයතනයක සාමාජිකයකු වේ නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ තිබේ නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත්වූවකු ලෙස හෝ බංකොලොත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබ නිදහස් කරනු නොලැබූ වස්තුභංගත්වයට පත්වූවකු වන හෝ බංකොලොත් බවට පත්වූවකු වන තැනැත්තෙක් වේ නම් ; හෝ

(ඈ) මාස හයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි, චරිත දූෂණය හා සම්බන්ධ වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම්,

ඔහු අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීමට හෝ තෝරා පත් කරනු ලැබීමට හෝ අධ්‍යක්ෂවරයකු ලෙස දිගටම කටයුතු කිරීමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

**10.** (1) රෝගාතුරවීම හෝ, අබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ හේතුකොට ගෙන තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයා අපොහොසත් වන අවස්ථාවක, මූල්‍ය මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා වෙනත් අධ්‍යක්ෂවරයකු පත් කළ හැකි ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයාගේ පත්වීම, කිසි හේතුවක් නොදක්වා, මූල්‍ය මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අවසන් කළ හැකි අතර, ඒ අවසන් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) සභාපතිවරයා විසින්, මූල්‍ය මණ්ඩලය අමතා යවන ලිපියක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්වය පවත්නා කාලසීමාව වන්නේ ය.

**11.** අධ්‍යක්ෂවරයන්ට මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික බැංකුවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

**12.** බැංකුව ඇතුළත් වීමට අදහස් කරන ගිවිසුමකට කෙලින්ම හෝ අනියමින් සම්බන්ධතාවයක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී ඒ සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කළ යුතු ය. ඒ හෙළිදරව් කිරීම මණ්ඩලයේ සභා වාර්තාවල වාර්තාගත කළ යුතු අතර ඒ ගිවිසුම හා සම්බන්ධව ඒ මණ්ඩලයේ කිසිම කරුණු සලකා බැලීමකට හෝ තීරණයකට ඒ අධ්‍යක්ෂවරයා සහභාගි නොවිය යුතු ය.

**13.** (1) පැමිණ සිටින්නේ නම්, මණ්ඩලයේ සභාපතිවරයා, සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටිය හොත්, පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින්, පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් අතුරෙන් එක් අධ්‍යක්ෂවරයකු, ඒ රැස්වීමේ මූලාසනය ඉසිලීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(2) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතු ය.

(3) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට, තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් හිමි වන්නේ ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය විධිමත් කර ගත හැකි ය.

**14.** අධ්‍යක්ෂවරුන්ගේ යම් පුරප්පාඩුවක් හෝ අධ්‍යක්ෂවරයකු පත්කිරීමේ හෝ තෝරා පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කට-යුත්තක් අවලංගු නොවිය යුතු ය.

**15.** (1) මණ්ඩලය විසින් මණ්ඩලයේ බලතල හා කාර්ය අතුරින් යමක් සභාපතිවරයාට හෝ බැංකුවේ වෙනත් යම් සේවා නියුක්තයකුට පැවරිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කාර්යයක් පවරා දෙනු ලැබූ සෑම තැනැත්තකුම තමාට පවරා දෙනු ලැබූ ඒ බලය හෝ කාර්යය, මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

**16.** (1) බැංකුවේ මුද්‍රාව සභාපතිවරයාගේ භාරයේ හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) බැංකුවේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කළ හැකි ය.

(3) බැංකුවේ මුද්‍රාව, මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ඉදිරියේ හැර, කිසියම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ දෙදෙනාම එම සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය.

**17.** (1) මහා බැංකුවේ කොටස් ප්‍රමාණය 20 වන වගන්තිය යටතේ බෙදා හරිනු ලබන විට හෝ ඉන් පසුව, දෙළොස් දෙනෙකුගෙන් සමන්විත බැංකුවේ මහා සභාවක් විය යුතු ය. එම දෙළොස් දෙනා යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද හෝ පිහිටුවන ලද වාණිජ බැංකු විසින් එම බැංකු මහා සභාවේ නියෝජනය කිරීම සඳහා නම් කරන ලද හෝ බැංකුවේ කොටස් හිමියන් වන සමුපකාර සමිති විසින් එම සමිති බැංකුවේ මහා සභාවේ නියෝජනය කිරීම සඳහා තෝරා පත් කර ගන්නා ලද හෝ තැනැත්තන් විය යුතු ය.

(2) මණ්ඩලය විසින් —

(අ) කොටස් ප්‍රමාණය සැලකිල්ලට ගෙන මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඒ වාණිජ බැංකු විසින් නම් කරන ලද හෝ සමුපකාර සමිති විසින් තෝරා පත් කර ගන්නා ලද හෝ තැනැත්තන්ගේ සංඛ්‍යාව, තීරණය කළ හැකි ය.

(ආ) එසේ නම් කරනු හෝ පත් කරනු ලැබීම සඳහා තැනැත්තන්ට තිබිය යුතු සුදුසුකම් නිශ්චය කළ හැකි ය ; සහ

(ඇ) ඒ තැනැත්තන් බැංකුවේ මහා සභාවට තෝරා පත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චය කළ හැකි ය.

(3) බැංකුවේ මහා සභාවේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් පමණක්, ඒ මහා සභාව වෙත මේ පනතින් පැවරුණු කර්තව්‍ය ඉටු කිරීමෙහිලා නුසුදුසු නොවිය යුතු ය.

**18.** බැංකු සහ කාර්මික සේවක පිරිස, ගොවියන් සහ ශිල්පීන් සහ ඊට සමාන කටයුතුවල යෙදී සිටින වෙනත් තැනැත්තන් තනි තනිව හෝ කාණ්ඩ වශයෙන් හෝ සමුපකාර සමිති මගින් හෝ කෘෂිකර්මය, කර්මාන්ත, ධීවර කර්මාන්තය, වාණිජ්‍යය, වෙළඳාම හෝ වෙනත් සංවර්ධන ක්‍රියාවල පුහුණු කිරීම, බැංකුව විසින් දිරි ගන්වා ප්‍රවර්ධනය කළ හැකි අතර මේ කාර්ය සඳහා ඒ වෙනුවෙන් සිදුවන වියදම් දැරීමට බැංකුවට බලය පවරනු ලැබේ.

## III වන කොටස

## මුදල්

**19.** බැංකුවේ බලයලත් කොටස් ප්‍රාග්ධනය එකක් රුපියල් සියය බැගින් වූ කොටස් පන් ලක්ෂයකට බෙදනු ලැබූ රුපියල් පන් කෝටියක් විය යුතු ය.

**20.** (1) (7) වන උපවගන්තියට යටත්ව, තත් කාලයේ බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනය රුපියල් එක් කෝටියක් විය යුතු ය.

(2) බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනයට මහ බැංකුව සම්පූර්ණයෙන් දායක විය යුතු ය.

(3) සංස්ථාගත කිරීමේ දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවෙන් පසුව, මහ බැංකුව විසින්, නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට හතළිස් නවය දක්වා වූ කොටස්, යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද වාණිජ බැංකුවලට සහ සමුපකාර සමිතිවලට ඉදිරිපත් කළ හැකි ය.

(4) සමුපකාර සමිති විසින් දරනු ලබන සමස්ත කොටස් ප්‍රමාණයේ උපරිමය බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට දහයකට සීමා විය යුතු ය.

(5) යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද වාණිජ බැංකුවක් හෝ සමුපකාර සමිතියක් වන, බැංකුවේ කොටස් හිමියකුට අයිති කොටස්, ඒ වාණිජ බැංකුව හෝ සමුපකාර සමිතිය විසින් බැංකුවේ කොටස් හිමියකු නොවන වෙනත් තැනැත්තකුට කවර හෝ ආකාරයකින් අන්සතු කිරීම කරනු නොලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය කඩකරමින් කරන ලද යම් අන්සතු කිරීමක් ශූන්‍ය හා බලරහිත විය යුතු ය.

(7) බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනය මුල්‍ය මණ්ඩලය විසින් වැඩි කරනු ලැබිය හැකි අතර අතිරේක ප්‍රාග්ධනය නිකුත් කළ අවස්ථාවක, ඒ ප්‍රාග්ධනයට ද මේ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට දායක විය යුතු ය.

මේ වගන්තියේ සහ 17 වන වගන්තියේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද වාණිජ බැංකුව යන්නෙන්, ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද ලංකා බැංකුව, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව, (145 වන අධිකාරය වන) සමාගම් ආඥාපනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුව සහ සීමාසහිත ලංකා වාණිජ බැංකුව අදහස් වේ.

**21.** බැංකුව සංස්ථාගත කිරීමෙන් පසුව හැකි ඉක්මනින්, බැංකුව පිහිටුවීම සම්බන්ධ මූලික වියදම් පියවීම සඳහා වූ සම්පූර්ණ ප්‍රදානයන් වශයෙන් මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මුදලක් මහ බැංකුව විසින් වෙන් කළ යුතු ය.

**22.** (1) හය මාසයකට නොවැඩි වූ කාල සීමාව සඳහා වූ මුදල් ප්‍රමාණ, මූල්‍ය මණ්ඩලය විසින් ඒ මත වූ පොලිය සහ එය ආපසු ගෙවීම සම්බන්ධයෙන් තීරණය කරනු ලබන නියමයන් සහ කොන්දේසි මත, බැංකුව විසින් කලින් කල මහා බැංකුවෙන් ණයට ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බැංකුව විසින් ලබා ගන්නා ලද ණය මුදල් කිසිම අවස්ථාවක දී බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනය සහ බැංකුවේ නිදහස් සංචිතවලින් සියයට දහයකට සමාන මුදලක් නොඉක්මවිය යුතු ය.

**23.** බැංකුව විසින් මූල්‍ය මණ්ඩලයෙන් ලබාගත් පූර්ව අනුමතිය ඇතිව, කලින් කල ආණ්ඩුවෙන් ණයට ගැනීමද, ඒකාබද්ධ අරමුදලින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, ආණ්ඩුව විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි යටතේ, ආණ්ඩුව විසින් මහා බැංකුව මගින් කලින් කල බැංකුවට ණයට දීම ද කළ හැකි ය.

**24.** බැංකුව විසින් කලින් කල, මූල්‍ය මණ්ඩලයෙන් ලබාගත් පූර්ව අනුමතය ඇතිව යම් විදේශ ආණ්ඩුවකින් හෝ ශ්‍රී ලංකාවේ බැහැර කවර හෝ ප්‍රභවයකින්, යම් මුදල් ප්‍රමාණයක් ඒ මත වූ පොලිය සහ එය ආපසු ගෙවීම සම්බන්ධයෙන් මූල්‍ය මණ්ඩලය හා අවස්ථාවෝචිත පරිදි, ඒ විදේශ ආණ්ඩුව හෝ වෙනත් ප්‍රභවය අතර එකඟත්වයෙන් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි මත ණයට ගනු ලැබිය හැකි ය.

**25.** බැංකුව විසින් පොදු සංචිත අරමුදලක් පිහිටුවිය යුතු අතර සෑම අවුරුද්දකම එහි වාර්ෂික ලාභවලින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සියයට ගණනක් ඒ අරමුදලට බැර කළ යුතු ය.

**26.** බැංකුව විසින් බොල් සහ සැක සහිත ණය සඳහා වූ විශේෂ සංචිත අරමුදලක් පිහිටුවිය යුතු අතර සෑම අවුරුද්දකම එහි වාර්ෂික ලාභවලින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සියයට ගණනක් එම අරමුදලට බැර කළ යුතු ය.

**27.** විශේෂිත සේවා සුරක්ෂිත කිරීමෙහි ලා සහ ඊට ආනුෂංගික මණ්ඩලය විසින් දරනු ලබන වියදම් බැංකුව විසින් පියවනු හැකි වනු වස් බැංකුව විසින් " කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලක් " යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අරමුදලක් පිහිටුවීම, පවත්වාගෙන යාම, කළමනාකරණය කිරීම හා පාලනය කිරීම කළ හැකි අතර බැංකුව විසින් බැංකුවේ සම්පත්වලින් එවැනි අරමුදලක් පිහිට වූ කර්තව්‍ය ඉටු කිරීම සඳහා බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන මුදල් ප්‍රමාණ කලින් කල අරමුදලට මාරු කළ හැකි ය.

**28.** (1) දේශීය හෝ විදේශීය සංවිධානවලින් ලැබෙන ප්‍රදාන හෝ පරිත්‍යාග පිළිගැනීම සඳහා මේ වගන්තියේ " අරමුදල " යනුවෙන් සඳහන් කරනු ලබන " විශේෂ සම්පත් අරමුදල " වශයෙන් හැඳින්වෙන වෙන අරමුදලක් බැංකුව විසින් පිහිටුවනු ලැබිය යුතු ය. අරමුදල

බැංකුවේ පොදු අරමුදල්වල කොටසක් නොවිය යුතු ය. එහෙත් එය ආණ්ඩුව සඳහා හෝ ඒ වෙනුවෙන් වූ හෝ ආණ්ඩුව විසින් අනුමත කරනු ලබන එවැනි යම් විදේශීය ආණ්ඩුවක්, විදේශීය හෝ ජාත්‍යන්තර සංවිධානයක් හෝ තැනැත්තකු හෝ තැනැත්තන් සඳහා වූ හෝ පොදු අරමුදල් වලින් වෙන් වූ බැංකුව විසින් පරිපාලනය කරනු ලැබිය යුතු වෙනම අරමුදලක් විය යුතු ය.

(2) ත්‍යාගදයක හා බැංකුව අතර ඇතුළත් වූ යම් එකඟවීමක නියමයන් ප්‍රකාර, යම් කෘෂිකාර්මික, කාර්මික, ධීවර, වාණිජ්‍යය හෝ වෙනත් ව්‍යවසායයක් වෙත අරමුදලෙන් යම් ණයක්, අත්තිකාරම් මුදලක්, ප්‍රදනයක් හෝ වෙනත් මුදල් පහසුකමක් සැලසීමට හෝ දීමට බැංකුව මෙයින් බලය දෙනු ලැබේ.

(3) ත්‍යාගදයක විසින් අරමුදලේ කාර්ය සඳහා දෙනු ලැබූ සියලු පරිත්‍යාග සහ ප්‍රදානවල මුදල බැංකුව විසින් අරමුදලට බැර කරනු ලැබිය යුතුය. අරමුදල ක්‍රියාත්මකවීමේ හේතුවෙන් ලැබෙන ශුද්ධ ආදයම හෝ පොලිය අතිරේක වශයෙන් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) අරමුදලේ කාර්ය කරගෙන යාමේ අරමුණ ඇතිව බැංකුව විසින් කරන ලද යම් ක්‍රියාවකින් හෝ දෙයකින් උද්ගතවන හෝ ඒ සම්බන්ධයෙන් දරන ලද සියලු මුදල් වැය හෝ බැඳීම් අරමුදලට වැය බරක් විය යුතු ය.

(5) අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමෙහි ලා වහාම යොදවනු නොලැබිය හැකි අරමුදලේ අතිරික්ත සම්පත්, අරමුදලේ දිගු කාලීන අභිවෘද්ධියට හානියක් නොමැතිව, මණ්ඩලය විසින් උචිත යයි සලකනු ලබන යම් සුරැකුම්පත්වල මණ්ඩලය විසින් තාවකාලිකව ආයෝජනය කරනු ලැබිය හැකි ය.

(6) පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් යමක් සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය :—

(අ) අරමුදලේ ගිණුම් තැබිය යුතු ආකාරය ;

(ආ) බොල් සහ සැක කටයුතු ණය, වත්කම් ක්ෂයවීම සහ සාමාන්‍ය බැංකු කටයුතුවලදී සිදුවිය හැකි වෙනත් යම් අවිනිශ්චිත අවස්ථා සඳහා අරමුදලේ සංචිත පිහිටුවීම ;

(ඇ) අරමුදල පියවීම හෝ ගණින් බේරා විසා දැමීම ; සහ

(ඈ) ඉහත කී කරුණු අතුරෙන් යම් කරුණක් හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් යම් කරුණු.

**29.** මූල්‍ය නීතිය පනතේ කුමක් සඳහන් වුවද එය නොතකා මූල්‍ය නීතිය පනතේ 93 වන වගන්තියේ විධිවිධාන බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ වූ දිනට පසු වර්ෂ තුනක කාල සීමාවක් සඳහා බැංකුවට හෝ බැංකුව සම්බන්ධයෙන් අදළ නොවිය යුතු අතර ඊළඟ අවුරුදු තුනක කාල සීමාවක් සඳහා එම වගන්තිය යටතේ එම බැංකුව විසින් පවත්වාගෙන යාමට නියමිත සංචිත ප්‍රමාණයෙන් භාගයක් පමණක් පවත්වාගෙන යාමට එම බැංකුවට නියම කළ යුතු ය.

**30.** බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ වූ දිනයට ඉක්බිතිව වූ දස අවුරුදු කාලයක් සඳහා බැංකුවේ ලාභ සහ ආදයම් මත වූ ආදයම් බදු ගෙවීමෙන් බැංකුව නිදහස් කරනු ලැබිය යුතු ය.

**31.** (1) බැංකුව විසින් දෙනු ලබන යම් ණයක්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ඇප සහ වෙනත් නියම සහ කොන්දේසි මත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද මණ්ඩලය විසින් යම් ණයක් දිය යුත්තේ යම් යෝජනා ක්‍රමයක් හෝ කාර්යයක් සඳහා ද ඒ යෝජනා ක්‍රමයේ හෝ කාර්යයේ ස්වභාවය සහ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින්, මණ්ඩලය විසින් ලිඛිතව සටහන් කරනු ලබන හේතූන් මත ඇපයක් අනවශ්‍ය යයි මණ්ඩලය තීරණය කරන යම් අවස්ථාවලදී මූල්‍ය මණ්ඩලය විසින් සඳහන් කරනු ලබන කාර්ය සඳහා ඇපයක් නොමැතිව, මණ්ඩලය විසින් ස්වකීය නියත අභිමතය පරිදි ණය දෙනු ලැබිය හැකි ය.

## IV වන කොටස

## කාර්ය මණ්ඩලය

**32.** (1) සභාපතිවරයා, බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතුය.

(2) මණ්ඩලයේ පොදු විධානයට හා පාලනයට යටත්ව බැංකුවේ ගනුදෙනු මෙහෙයවීම, බැංකුවේ බලතල විධිමත් කිරීම සහ ක්‍රියාවේ යෙදවීම සහ බැංකුවේ සේවකයන් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම සභාපතිවරයාට භාර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතින් තමා වෙත පැවරි ඇති හෝ නියම කර ඇති හෝ වෙන්කර ඇති යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක්, බැංකුවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම අවශ්‍යයයි තමා සලකන කවර විටකදී වුවද මණ්ඩලයේ අනුමතය ඇතිව සභාපතිවරයා විසින්, එය ලිඛිතව කරනු ලැබිය හැකි අතර, සභාපතිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒ නිලධරයා හෝ සේවකයා විසින් ඒ බලය, කර්තව්‍යය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම, කරනු ලැබිය යුතු ය.

**33.** (1) මණ්ඩලයේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීමෙහි ලා අවශ්‍ය යයි සලකන වෙනත් නිලධරයන් සහ සේවකයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණවලට අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර එසේ තීරණය කරනු ලබන සේවා කොන්දේසි වලට ද ඔවුන් යටත් විය යුතු ය.

## V වන කොටස

## ණය ආපසු අයකර ගැනීම

**34.** ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ V වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, බැංකුව විසින් ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VI වන කොටස

## විගණනය සහ ගිණුම්

**35.** බැංකුවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

**36.** (1) බැංකුවේ ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීම මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන බැංකුවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**37.** 1982 අංක 17 දරන සමාගම් පනතේ IX වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, බැංකුව විසුරුවා හැරීමට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VII වන කොටස

## සාමාන්‍ය කරුණු

**38.** බැංකුවේ තැන්පතුවක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් හෝ ඇති අවුරුදු දහසයට වැඩි යම් තැනැත්තකු විසින් ඔහු මියයෑමේදී එම තැනැත්තාගේ බැරට ඇති මුදල් ගෙවනු ලැබිය යුතු තැනැත්තකු නම් කළ යුතු අතර 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 44 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නම් කරනු ලැබීමට සහ ඒ සම්බන්ධයෙන් ද එම ගිණුමේ මුදල් එසේ නම් කරනු ලැබූ තැනැත්තාට ගෙවනු ලැබීමට සහ ඒ සම්බන්ධයෙන්ද අදාළ විය යුතු ය.

**39.** පහත දැක්වෙන ලිඛිත නීතිවල විධිවිධාන බැංකුවට අදාළ නොවිය යුතුය :—

(අ) මුදල් ණයට දීමේ ආඥාපනත ;

(ආ) ණය සහතදායක ආඥාපනත ;

(ඇ) බඩු උකස් ගන්නන්ගේ ආඥාපනත.

**40.** බැංකුවේ මහ සභාව තෝරා පත්කර ගැනීම සඳහා කොටස් හිමියන්ගේ රැස්වීම්වල කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

**41.** බැංකුව, (89 වන අධිකාරය වූ) උකස් පනතේ අර්ථානුකූලව අනුමත ණය නියෝජ්‍යායතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**42.** 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ කුමක් සඳහන් වුවද එය නොතකා බැංකුව විසින් සාදනු ලැබීමට හෝ ලියා අත්සන් කරනු ලැබීමට නියමිත හෝ බලය පැවරී ඇති යම් සාධන පත්‍රයක් හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් බැංකුව විසින් සාදනු ලබන හෝ ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් සහ ණයක් සඳහා වන යම් ඇපයක් සම්බන්ධයෙන් බැංකුවේ නමට යම් යම් තැනැත්තකු විසින් සාදනු ලබන හෝ ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් එම පනත යටතේ ගාස්තු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

**43.** 1961 අංක 65 දරන මුදල් පනතේ 22 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී ඇත ද, මේ පනත යටතේ පිහිටුවන ලද බැංකුවෙහි ඕනෑම තැනැත්තකු විසින් ගිණුම් විවෘත කරනු ලැබිය හැකි ය.

**44.** බැංකුවෙහි සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු ඕනෑකමින් ම කරන ලද ක්‍රියාවකින් හෝ පැහැර හැරීමකින් හැර, ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී, එහා ඉටු කිරීම සම්බන්ධයෙන් හෝ ඔහු විසින් දරන ලද සියලු අලාභහානි සහ වියදම්, බැංකුව විසින් හානිපූරණය කරනු ලැබිය යුතු ය.

**45.** (1) බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, විගණකවරයකු ම, නිලධරයකු ම හෝ වෙනත් සෑම සේවා නියුක්තයකු ම හෝ අනුයෝජිතයකු ම හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතුවල නියුක්ත වෙනත් සෑම තැනැත්තකු ම විසින්, ස්වකීය කාර්ය ආරම්භ කිරීමට පෙර, බැංකුවේ සියලු ගනුදෙනු, එහි ගනුදෙනුකරුවන්, යම් තැනැත්තකු හෝ ආයතනයක් සමග එහි ගිණුම් පිළිබඳ තත්ත්වය සහ ඒවාට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාව රකින බවට ප්‍රතිඥා දෙන ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර, ස්වකීය කාර්ය ඉටු කිරීමේදී තමාට දැනගන්නට ලැබෙන වෙනත් යම් කරුණු —

(අ) ඒවා හෙළිදරව් කරන ලෙස—

(i) මණ්ඩලය විසින් ; හෝ

(ii) අධිකරණයක් විසින් ; හෝ

(iii) ඒ කරුණු අදාළ වන තැනැත්තා විසින් ; හෝ

(vi) මූල්‍ය මණ්ඩලය විසින් ; හෝ

නියම කරනු ලබන විටක ;

(ආ) ස්වකීය කාර්යයන් ඉටු කිරීමෙහි ලා ; සහ

(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධාන අතුරින් කිසිවක් අනුව ක්‍රියා කිරීම පිණිස

හැර හෙළිදරව් නොකිරීමට ද ඒ ප්‍රකාශයෙන් ඔහු විසින් ප්‍රතිඥා දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ තම රහස්‍යතා ප්‍රතිඥාව කඩනොකර බැංකුවේ ව්‍යාපාර කටයුතුවලට අදාළ යම් ප්‍රශ්නයකට පිළිතුරු දිය නොහැකි නම්, බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, විගණකවරයකු ම, නිලධරයකු ම, හෝ වෙනත් සෑම සේවා නියුක්තයකුම හෝ අනුයෝජිතයකුම හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතුවල නියුක්ත වෙනත් සෑම තැනැත්තකු ම විසින් ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා විසින් අත්සන් තබන ලද යම් ප්‍රකාශයක් කඩකරමින් යම් තොරතුරක් හෙළිදරව් කරන බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, විගණකවරයකු ම, නිලධරයකු ම, හෝ වෙනත් සෑම සේවා නියුක්තයකුම හෝ අනුයෝජිතයකුම හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතුවල නියුක්ත වෙනත් සෑම තැනැත්තකු ම විසින් මේ පනත යටතේ වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට, ඔහු රුපියල් දෙදහසක නොඉක්මවන දඩයකට, ඒ දඩ මුදල ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාවේ යෙදවීමේ දී මහෙස්ත්‍රාත් වරයකු විසින් පනවනු ලබන දඩ මුදල ඉක්ම වුව ද, යටත් විය යුතු ය.

**46.** බැංකුවේ ප්‍රතිපත්තිය සහ කාර්යයන් ඉටු කිරීම පිළිබඳව සහ, බලතල ක්‍රියාවේ යෙදවීම සම්බන්ධව, මූල්‍ය මණ්ඩලය විසින් කලින් කල, මණ්ඩලය වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින්, එම විධාන ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

**47.** මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර, යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් ඇති විටක, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

**48.** (1) රීති සෑදීමට මේ පනත යටතේ නියම කරනු ලැබ හෝ බලය දී තිබෙන්නේ යම් කරුණු සම්බන්ධයෙන් ද ඒ කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින්, රීති සාදනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් මේ පනත යටතේ සාදන ලද කිසිම රීතියක්, එය මූල්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන තුරු බල නොපැවැත්විය යුතු ය.

**49.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

" බැංකුවේ ව්‍යාපාර කටයුතු " යන්නෙන් ඉල්ලුම් කළ විට ආපසු ගෙවනු ලැබිය යුතු මුදල් තැන්පතු බාර ගැනීම මගින් මහජනයාගෙන් මුදල් ලබා ගැනීමේ සහ ඒ මුදල් සියල්ල හෝ ඉන් කොටසක් අත්තිකාරම්, ආයෝජන හෝ නීතියෙන් නැතහොත් සම්ප්‍රදායික බැංකු පරිචයන් මගින් අවසර දී ඇති වෙනත් මෙහෙයුම් හෝ සඳහා ඒ මුදල් යොද ගැනීමේ ව්‍යාපාර කටයුතු අදහස් වේ ;

" මහ බැංකුව " යන්නෙන්, (422 වන අධිකාරය වූ ) මුදල් නීති පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ ;

" වාණිජ බැංකුව " යන්නට (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ ඇති අර්ථයම විය යුතුය ;

" සමුපකාර සමිතිය " යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් අදහස් වේ ;

" ව්‍යවසාය " යන්නෙන් කවර හෝ නමකින් හෝ පදවි නමකින් හැඳින්වෙන, සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර, ඊට ඒක පුද්ගල සංස්ථාවක් හෝ තනි හිමිකාරකමක් ඇතුළත් වේ ;

" බැංකුවේ මහ සභාව " යන්නෙන් මේ පනතේ 17 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව පිහිටුවන ලද බැංකුවේ මහ සභාව අදහස් වේ ;

" මූල්‍ය මණ්ඩලය " යන්නෙන් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය අදහස් වේ ;

" සුළු පරිමාණ කර්මාන්ත " යන්නෙන් තාක්ෂණය හෝ පිහිටීම කුමක් වුව ද ඉඩම්, ගොඩනැගිලි සහ උපයෝගිතා හැර, යන්ත්‍රාගාර සහ යන්ත්‍ර සූත්‍ර සම්බන්ධයෙන් වූ ආයෝජනය රුපියල් දස ලක්ෂය නොඉක්මවන යම් කර්මාන්තයක් අදහස් වේ.

# 1985 අංක 16 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 අප්‍රේල් මස 25 වන දින.]

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1985 අංක 16 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය '' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදයේ (XLiii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(XLiv) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ;

(XLV) 1985 අංක 2 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල පනතින් පිහිටුවන ලද බලශක්ති සංරක්ෂණ අරමුදල ;

(XLVi) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතින් පිහිටුවන ලද කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ;

(XLVii) 1963 අංක 11 දරන මුදල් පනත යටතේ පිහිටුවන ලද සමුපකාර සංවර්ධන අරමුදල ;

(XLViii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතින් පිහිටුවන ලද මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (ඉ) ඡේදයේ ''අවුරුදු හය '' යන වචන වෙනුවට ''අවුරුදු දහය '' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි ''වර්ෂයක් තුළ නම්,'' යන වචන වෙනුවට ''වර්ෂයක් තුළ නම් ;'' ; යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ඈ) 1985 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුට ලැබුණු දල ලාභාංශවල එකතුවෙන් රුපියල් දොළොස් දහසක් නොඉක්මවන ඒ පුද්ගලයාගේ ආදායමේ ඒ කොටස ;''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (උ) ඡේදයේ " යම් යෝජනා ක්‍රමයක් යටතේ ". යන වචන වෙනුවට "යම් යෝජනා ක්‍රමයක් යටතේ ;" ; යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඌ) යන්ත්‍රෝපකරණය සඳහා 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් සංවර්ධන අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන මෝල් සංවර්ධන අරමුදලින්.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ ඡේදයේ (ii) අනුඡේදයේ "අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (ii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iii) නැව් අලුත්වැඩියා කිරීම, නැව් කැඩීම, සමුද්‍රීය නැව් බඩු ඇහුරුම් බඳුන් අලුත්වැඩියා කිරීම හා නැවත සැපයීම, කොම්පියුටර් මෘදු භාණ්ඩ, කොම්පියුටර් වැඩ සටහන් සහ කොම්පියුටර් පද්ධති සැලසීම, කොම්පියුටර් දත්ත වාර්තාගත කිරීම යන සේවාවලට විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම් සඳහා 1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු සංස්ථාගත කරන ලද යම් සමාගමක් විසින් 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1989 මාර්තු මස 31 වන දිනට පෙරාතුව ඒ සේවාවන් සැලසීම ආරම්භ කරනු ලබන්නේ නම් සහ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තියේ (ඇ) ඡේදයේ "සම්බන්ධයෙන් වන විට," යන වචන වෙනුවට "සම්බන්ධයෙන් වන විට, 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (ජ) ඡේදයේ "තැනැත්තා විසින් දරන ලද වියදම් " යන වචන වෙනුවට "තැනැත්තා විසින් දරන ලද වියදම් ; සහ "; යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ට) ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන වෙළෙඳාම්, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව නතර කිරීම නිසා යම් සේවා නියුක්තයකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම මත ඒ සේවා නියුක්තයාට පාරිතෝෂිකයක් ගෙවීමේ දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම්.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (3) වන උපවගන්තියේ " වාණිජ ගොඩනැගිලි කුලියට දීමේ " යන වචන වෙනුවට "වාණිජ කාර්ය සඳහා ස්ථාන කුලියට දීමේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එහි (iv) වන අනුඡේදයේ " ගෙවනු ලැබිය යුතු ය ; තවද " යන යෙදුම ඉවත් කොට ඒ වෙනුවට " ගෙවනු ලැබිය යුතු ය "; යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (v) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ;

"(v) 1984 නොවැම්බර් මස 14 වන දින හෝ ඉන් පෙර ඇති කරන ලද වාර්ෂිකයක් වශයෙන් අවුරුදු හයක් නොඉක්මවන කාලයක් සඳහා ඔහු විසින් යම් මුදලක් ගෙවිය යුතු වන අවස්ථාවක, ඒ වාර්ෂිකය, වටිනා සහ ප්‍රමාණවත් ප්‍රතිෂ්ඨාවක් සඳහා හෝ ඒ වාර්ෂිකය ලබන්නාගේ ජීවිතාන්තය දක්වා වූයේ නම් මිස, ඒ වාර්ෂිකය ඇති කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයකදී ද ඒ තක්සේරු වර්ෂය තුළ සහ ඒ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක් තුළ ඔහු විසින් ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබිය යුතු ය ; තව ද

(vi) 1984 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසුව ඇති කරන ලද වාර්ෂිකයක් වශයෙන් ඔහු විසින් යම් මුදලක් ගෙවිය යුතුවන අවස්ථාවක, ඒ වාර්ෂිකය—

(අ) දික්කසාද දීමනාව හෝ නඩත්තු ගෙවීම වශයෙන් අධිකරණයේ ආඥාවක් යටතේ ගෙවනු ලබන්නේ නම් ;

(ආ) යථා පරිදි ලියා අත්සන් කරන ලද වෙන්වීමේ ඔප්පුවක් යටතේ ඔහුගේ කලත්‍රයාට ගෙවනු ලබන්නේ නම් ; හෝ

(ඇ) මුදලින් හෝ මුදලේ වටිනාකමෙහි සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව වෙනුවෙන් ගෙවනු ලබන්නේ නම්

මිස, ඒ වාර්ෂිකය ඇති කරනු ලැබුවේ යම් තක්සේරුවර්ෂයකදී ද ඒ තක්සේරු වර්ෂය තුළ සහ ඒ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක් තුළ ඔහු විසින් ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබිය යුතු ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (අආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අආ) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් රුපියල් දහඅට දහසක දීමනාවක් ;" ;

සහ

(ආ) ඒ උපවගන්තියේ (අඅ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(අඅඅ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් විසිහතර දහසක දීමනාවක් සහ ,'; තවද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියෙහි—

(අ) (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

''(ඇ) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් රුපියල් දහඅට දහසක දීමනාවක් ; සහ

(ආ) (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ඈ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් විසිහතර දහසක දීමනාවක්.''.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ''(5) වන උප වගන්තියේ'' යන යෙදුම වෙනුවට ''(5) වන උපවගන්තියේ සහ (5අ) උපවගන්තියේ'' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඔ) ඡේදයේ (vii) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(viii) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට. '' ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ච) ඡේදයෙහි '' පුද්ගලයකු'' යන වචනය වෙනුවට '' වාසික පුද්ගලයකු'' යන වචන ආදේශ කිරීමෙන් ;'' සහ ''අවුරුදු විසිපහකට අඩු'' යන වචන වෙනුවට ''අවුරුදු තිහකට අඩු විවාහක හෝ'' යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(5) යම් තැනැත්තකු විසින් යම් තක්සේරු වර්ෂයක දී කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන, (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් ගෙවීම් නොවන සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන්—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ, සහ

(ආ) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සමාගමක තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම, ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එක් පංගුවක් නො නොඉක්මවිය යුතු ය.'' ;

(5) (5) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(5අ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම—

(i) ඒ තක්සේරු වර්ෂයේදී ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් ගෙවීම් නොවන සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එක් පංගුවක් හෝ රුපියල් පන් ලක්ෂයක් යන මේ ප්‍රමාණ දෙකෙන් වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය ;

(ii) ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවිය යුතු ය ;

(iii) (i) වන සහ (ii) වන අනුඡේදවල සඳහන් සුදුසුකම් ලබන ගෙවීම්වල එකතුව සම්බන්ධයෙන් රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවිය යුතු ය.''.

(6) ඒ වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(7අ) යම් සමාගමක කොටස් කිසිවක් මිලට ගැනීම සම්බන්ධයෙන් (i) වන උපවගන්තිය යටතේ දීමනාවක් තම තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කර ගැනීමට හිමිකම් ඇති යම් තැනැත්තකු විසින්, ඒ කොටස් විකුණා ඇත්තා වූ සහ ඒ විකිණීමේ දින සිට මාස තුනක් ඇතුළත ඒ උපවගන්තිය යටතේ ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමකට ඔහුට හිමිකම් ඇති වෙනත් සාමාන්‍ය කොටස් මිලට ගෙන ඇත්තා වූ අවස්ථාවක, දෙවනුව සඳහන් කොටස් මිලට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට හිමිකම් ඇති ආදායම් බද්දෙන් අඩු කිරීම, පළමුව සඳහන් කොටස් මිලට ගැනීමේ ප්‍රතිඵලය වශයෙන් ඔහුට හිමිකම් ලැබුණු ආදායම් බද්දෙන් අඩු කිරීමේ මුදල් ප්‍රමාණයෙන් අඩු කරනු ලැබිය යුතු ය.'' ;

(7) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ ''(ආ) ඡේදයෙහි'' යන වචන වෙනුවට ''(ආ) සහ (ක) ඡේදවල'' යන වචන ආදේශ කිරීමෙන් ; තවද ;

(8) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ (අ) ඡේදයේ (1) වන අනුඡේදයේ (ඉ) විෂයය (ඊ) විෂයය වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් සහ නැවත අක්ෂර යොදන ලද විෂයට පෙරාතුවම පහත දැක්වෙන විෂයය ඇතුළත් කිරීමෙන් :—

''(ඉ) (i) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අධික සේවා වියුක්තියක් ඇති ප්‍රදේශයක් වශයෙන් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන ප්‍රදේශයක ස්වකීය සෑදීම හෝ නිෂ්පාදනය ආරම්භ කරන ; සහ

(ii) තැනැත්තන් විසිපස් දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරන ව්‍යවසායයක් වන බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය සෑදීම හෝ නිෂ්පාදනය සඳහා වූ කාර්මික ව්‍යවසායයක් පවත්වා ගෙන යන්නා වූ ; හෝ.''.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) (අ) ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කොට, ඒවෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

''(iii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඅ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව;''.

(ආ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(iv) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උප ලේඛනයේ IIආ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ;''; සහ;

(ඇ) ඒ අතුරු වගන්තියේ (i) වන සහ (ii) වන අනුඡේද ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

'' (i) 1980 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ තුන සම්බන්ධයෙන් රුපියල් දොළොස් දහසක් ;

(ii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් දහඅට දහසක් ; සහ

(iii) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් විසිහතර දහසක්.''.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන අනුඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

'' (ii) 1980 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂ තුන සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසෙහි ; හෝ

(iii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් IIඅ කොටසෙහි ; හෝ

(iv) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් IIආ කොටසෙහි.''.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදයේ ''එම තක්සේරු වර්ෂයක් සඳහා බදු ගෙවිය යුතු ආදායමෙන් සියයට පහක අතිරේක මුදලකින් සහ'' යන වචන වෙනුවට ''1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඒ වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායමෙන් අතිරේක සියයට පහකින් ; සහ '' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ '' යම් තක්සේරු වර්ෂයක් තුළ '' යන වචන වෙනුවට ''1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය තුළ'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (6) (4) වන උපවගන්තියේ සහ (5) වන පවගන්තියේ කාර්යය සඳහා පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදායමට 11 වන වගන්තියේ (ඈ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් ඔහුගේ ආදායමේ යම් කොටසක් ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.''.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(1) ''ශුද්ධ ධනය'' යන්නෙන් මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරනු ලැබූ—

(අ) මුදලින් හෝ මුදල්වල වටිනාකමින් ප්‍රතිෂ්ඨාවක් නොමැතිව හෝ අසම්පූර්ණ ප්‍රතිෂ්ඨාවක් සඳහා හෝ ඇතිකර ගත් යම් ණයක් නොවන ;

(ආ) තමා විසින් ඇතිකර ගත් සම්පූර්ණයෙන් තමාගේ ම ප්‍රයෝජනය සඳහා නොවූ යම් ණයක් නොවන ;

(ඇ) වෙනත් යම් තැනැත්තකුගෙන් ප්‍රතිපූරණයක් ලබාගත නොහැකි වන්නේ නම් මිස, ප්‍රතිපූරණයක් ලබා ගැනීමට තමාට අයිතිවාසිකමක් ඇති යම් ණයක් නොවන ;

(ඈ) යම් ණයවීමකින් ලබා ගන්නා ලද මුදලක්, ඔහුගේ ධනයට ඇතුළත් කරනු ලැබූ යම් දේපළක් මිළ දී ගැනීමට, වැඩි දියුණු කිරීමට හෝ නඩත්තු කිරීමට ඔහු විසින් උපයෝගි කරනු ලැබුවේ නම් මිස, මේ පරිච්ඡේදය යටතේ ධනයෙන් බැහැර කරනු ලැබූ යම් දේපළකට වැය බරක් වූ හෝ එවැනි දේපළක ඇපයපිට ඇතිකර ගත් හෝ ඒ දේපළ සම්බන්ධයෙන් ඇතිකර ගත් යම් ණයක් නොවන ; සහ

(ඉ) ශ්‍රී ලංකාවේ දී ගෙවීමට ගිවිස ගත් හෝ ශ්‍රී ලංකාවේ දේපළකට වැය බරක් වූ හෝ එවැනි දේපළක ඇපය පිට ඇතිකර ගත් යම් ණයක් නොවන, ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ඇති කරගත් යම් ණයක් නොවන

(i) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දින වූ යම් තැනැත්තකුගේ ධනයේ ; සහ

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ අවසාන දින වූ යම් තැනැත්තකුගේ ධනයේ

යමස්ත වටිනාකම ඒ දිනයෙහි දී ඔහු විසින් ගෙවිය යුතු සියලුම ණය වල සමස්ත වටිනාකම ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින් ද ඒ ප්‍රමාණය අදහස් වන අතර, එහිලා දේපළෙහි වෙන් වෙන් කොටස්වලට වැය බරක් වූ එකම ණය එක් වරකට වඩා ගණන් ගනු නොලැබිය යුතු ය.''.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) නිර්වාසික සමාගමක් නොවන යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ධනය—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා රුපියල් දෙලක්ෂයක මුදලක් ඉක්මවන, ඒ තැනැත්තාගේ ශුද්ධ ධනයේ ඒ කොටස විය යුතු ය ; තව ද

(ආ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් පන්ලක්ෂයක මුදලක් ඉක්මවන ඒ තැනැත්තාගේ ශුද්ධ ධනයේ ඒ කොටස විය යුතු ය.

තව ද, ඒ බදු අය කළ හැකි ධනය සම්බන්ධයෙන් ධන බද්ද ගෙවීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්—

''(1) යම් නිශ්චල දේපළක වටිනාකම—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයේ පැවති එහි වෙළෙඳ අගය විය යුතු ය ; තවද

(ආ) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තක්සේරු වර්ෂයේ අවසාන දින පැවති එහි වෙළෙඳ අගය විය යුතු ය:

එසේ වුවද, (මේ උපවගන්තියෙහි ''තක්සේරු කරනු ලබන්නා'' යනුවෙන් සඳහන් කරනු ලබන) තක්සේරු කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ධනය ද ඒ තැනැත්තාගේ ඒ ධනයේ කොටසක් ලෙස ඒ දේපළ 1977 අප්‍රේල් මස 1 වන දින සංයුක්ත වන්නේ නම් හෝ 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළ අයිතිව සිටි හෝ ඒ දේපළෙහි සම්බන්ධතාවක් දරනු ලැබූ වෙනත් තැනැත්තකු විසින් කරන ලද ත්‍යාගයකින් හෝ උරුමයෙන් ඒ දේපළ අත්කර ගනු ලැබුවේ නම්—

(i) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමුවන දින සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂයේ පළමුවන දින ; සහ

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක අවසාන දින

ඒ දේපළෙහි වෙළෙඳ අගය වූ කලී, 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ දේපළ සම්බන්ධයෙන් කරන ලද යම් වැඩි දියුණු කිරීම්වල, එකතු කිරීම්වල හෝ වෙනස් කිරීම්වල වියදමට සමාන ප්‍රමාණයකින් වැඩි වූ 1977 අප්‍රේල් මස 1 වන දින එහි වෙළෙඳ අගය හෝ—

(අ) (i) වන අනුඡේදයේ සඳහන් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට ඒ තක්සේරු වර්ෂයේ අප්‍රේල් මස 1 වන දින ; හෝ

(ආ) (ii) වන අනුඡේදයේ සඳහන් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් සඳහන් විට ඒ තක්සේරු වර්ෂයේ මාර්තු 31 වන දින

එහි වෙළෙඳ අගය හෝ යන මේ දෙකෙන් කවර වූ අඩු වෙළෙඳ අගය එහි වෙළෙඳ අගය ලෙස සලකනු ලැබිය යුතුය.''.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

''(අ) යම් චංචල දේපළක වෙළෙඳ අගය—

(i) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දින එහි වෙළෙඳ අගය විය යුතුය ; තවද

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තක්සේරු වර්ෂයේ අවසාන දින එහි වෙළෙඳ අගය විය යුතුය.'';

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ ''තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙහි සමාගමේ සම්පූර්ණ වත්කමේ වෙළෙඳ අගයෙන් පහත දැක්වෙන මිළ ගණන් අඩු කොට,'' යන වචන වෙනුවට ''1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙහි සහ 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ

වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ අවසාන දිනයෙහි සමාගමේ සම්පූර්ණ වත්කමේ වෙළෙඳ අගයෙන් පහත දැක්වෙන මිළ ගණන් අඩුකොට,'' යන වචන ආදේශ කිරීමෙන්.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ''ඒ තක්සේරු වර්ෂයෙ අප්‍රේල් මස 1 වන දින ඒ කොටස්වල පැවති වටිනාකම'' යන යෙදුම වෙනුවට, ''ත්‍යාග කරන ලද දින ඒ කොටස්වල පැවති වටිනාකම '' යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1අ) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (i) වන ඡේදයෙහි '' රුපියල් දොළොස් දහසක් ; සහ '' යන වචන වෙනුවට '' රුපියල් දොළොස් දහසක් ;'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ii) වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ;

''(ii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් දහ අට දහසක් ; සහ

(iii) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් විසි හතර දහසක්.''.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ XII වන පරිච්ඡේදයේ ඒ උපශීර්ෂයේ ''සංචාරක ව්‍යාපාර'' යන වචන වෙනුවට ''සංචාරක ව්‍යාපාර සහ අපනයන කටයුතු'' යන වචන ආදේශ කිරීමෙන් ඒ උප ශීර්ෂය මෙයින් සංශෝධනය කරනු ලැබේ''.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 85අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

'' අපනයන කටයුතුවල නිරත සමාගම්වල ඇතැම් ලාභ සහ ආදායම වෙනුවෙන් ආදායම් බදු සහන.

85අ. 20(I) වන වගන්තියේ හෝ 20අ(1) වන වගන්තියේ සඳහන් ව්‍යවසායක අපනයන පිරිවැටුමෙන් සමාගමක ශුද්ධ විදේශ විනිමය ඉපැයුම, එකී වගන්තිවල විධිවිධාන යටතේ ඒ සමාගමේ ලාභය සහ ආදායම මුළුමනින් ම හෝ ඉන් කොටසක් හෝ ආදායම් බද්දෙන් නිදහස් වන වර්ෂයේ අවසන් දිනයෙන් ඉක්බිතිව ම එළඹෙන වර්ෂ දහයක කාල පරිච්ඡේදය තුළ එක් එක් වර්ෂයේ (නැව් ගාස්තු සහ රක්ෂණ ගාස්තු අයකිරීමට පෙර) ඒ අපනයනවල වටිනාකමින් සියයට හැත්තෑ පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බවට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහතික කරනු ලබන අවස්ථාවක ඉහත සඳහන් වර්ෂ දහයේ කාල පරිච්ඡේදයේ කවර හෝ වර්ෂයක් සඳහා වන අපනයන ලාභය සහ ආදායම සම්බන්ධයෙන් සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්, නිශ්චිත මුදලින් සියයට පනහකට සමාන මුදලක් අඩු කිරීමට ඒ සමාගමට හිමිකම තිබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා —

(අ) ''අපනයන පිරිවැටුම '' සහ ''අපනයන ලාභ සහ ආදායම '' යන්නෙහි 20 වන වගන්තියෙහි ඒවාට දී ඇති අර්ථ ම ඇත්තේ ය ;

(ආ) ''නිශ්චිත මුදල '' යන්න යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යෙදෙන විට—

(i) වාසික සමාගමක් සම්බන්ධයෙන් වන විට, 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ දෙනු ලැබූ යම් සහනයක් අඩු කිරීමෙන් පසු, 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදයම් බද්දට, ඒ තක්සේරු වර්ෂය සඳහා, ඒ සමාගමේ අපනයන ලාභ සහ ආදයමත් ඒ සමාගමේ මුළු ලාභ හා ආදයමත් අතර ඇති අනුපාතයට සමාන අනුපාතයක් දරන මුදලක් ; සහ

(ii) නිර්වාසික නොවන සමාගමක් සම්බන්ධයෙන් වන විට, 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ දෙනු ලැබූ යම් සහනයක් අඩු කිරීමෙන් පසුව, 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදයම් බද්දට ඒ තක්සේරු වර්ෂය සඳහා, ඒ සමාගමේ අපනයන ලාභ හා ආදයමත් ඒ සමාගමේ මුළු ලාභ සහ ආදයමත් අතර ඇති අනුපාතයට සමාන මුදලක් ඉන් අදහස් වේ.''.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92අ වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 92අඅ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

''වාර්තාවල හා වෙනත් ලේඛනවල ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍රයේ අංකය ඇතුලත් විය යුතුය.

92අඅ. මේ පනතේ කාර්යය සඳහා 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ආදයම් බදු, ධන බදු හෝ ත්‍යාග බදු ගෙවීමට යටත් සෑම පුද්ගලයකු විසින් ම,—

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදයම, ධනය හෝ ත්‍යාග පිළිබඳ වාර්තාවෙහි—

(i) ඔහු 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් තැනැත්තකු නම්, ඔහුගේ හැඳුනුම්පත් අංකය ; හෝ

(ii) ඔහු, ඉහත කී පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් නොවන්නේනම්, ඔහුගේ පවත්නා විදේශ ගමන් බලපත්‍රයෙහි අංකය

දක්විය යුතුය.

(ආ) මේ පනතේ විධිවිධාන සාධාරණීය ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන යම් ගණුදෙනුවකට අදළ ලේඛනවල—

(i) ඔහු ඉහත කී පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් තැනැත්තකු නම් ඔහුගේ හැඳුනුම්පත් අංකය ; හෝ

(ii) ඔහු ඉහත කී පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් නොවන්නේ නම් ඔහුගේ පවත්නා විදේශ ගමන් බලපත්‍රයෙහි අංකය

දක්විය යුතු ය.''.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (3) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සහ (2) වන උපවගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් විසින් බෙද හරිනු ලැබූ ලාභාංශ සම්බන්ධයෙන් 33(1) (ආ) වගන්තිය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු සම්පූර්ණ බද්ද, ඒ ලාභාංශ බෙදීමේ දිනයට පසුව එළඹෙන 30 වන දින හෝ එදිනට පෙර ගෙවිය යුතු ය.''.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (1අ) 97 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් දිනයෙහි හෝ එදිනට පෙර සමාගමක් විසින් ගෙවිය යුතු සම්පූර්ණ බද්ද හෝ ඒ බද්දෙන් කොටසක් හෝ එසේ ගෙවා නොමැති අවස්ථාවක, ඒ බද්ද හෝ එහි කොටස පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ කාර්යය සඳහා ඒ සමාගම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.'' ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ii) ඡේදයේ " දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය ''; යන වචන වෙනුවට " දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා, 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් සම්බන්ධයෙන් වන විට ආදායම් බද්දට ඒ තක්සේරු වර්ෂයේ දී 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු බදු ඇතුළත් නොවිය යුතු ය. ''; යන කොටස ආදේශ කිරීමෙන්.''.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තියේ (1) වන උපවගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1අ) (මේ වගන්තියේ " හවුල් ගිණුම් ධාරක හෝ ධාරකයන් '' යනුවෙන් සඳහන් කරනු ලබන) පැහැර හරින්නා සහ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් සඳහා හා වෙනුවෙන් එක්ව, යම් තැනැත්තකු මුදල් දරන අවස්ථාවක, පැහැර හරින්නා විසින් දයක වූ මුදල්වලට ආරෝපණය කරනු ලැබිය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්ව ඇත්තා වූ සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් එලෙස සහතික කරනු ලැබ ඇත්තා වූ හවුල් ගිණුමෙහි ඇති මුදල්වලින් හෝ ඒ මුදල්වල ඒ කොටසින් දැන්වීමේ නම් කරන ලද නිලධරයාට පැහැර හැර ඇති බද්දේ මුදල හෝ එකී කොටස හෝ ගෙවන ලෙස නියම කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබිය හැකි ය :

එසේ වුවද—

(අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීම් අනුව ක්‍රියා කිරීමෙහි ලා මුදල් ප්‍රේෂණය කරන සෑම තැනැත්තකු ම, ඒ සිද්ධිය පිළිබඳව වෙනත් සෑම හවුල් ගිණුම් ධාරකයකුට ම දැනුම් දිය යුතු ය ;

(ආ) පැහැර හරින්නා හැර වෙනත් සෑම හවුල් ගිණුම් ධාරකයකු විසින්, (අ) ඡේදය යටතේ දැනුම්දීමක් තමා වෙත ලැබුණු දින සිට සති දෙකක් ඇතුළත කොමසාරිස් ජනරාල්-වරයා විසින් නිකුත් කරන ලද දැන්වීමේ දිනට ඒ හවුල් ගිණුමෙහි ශේෂයට ඔහුගේ ශුද්ධ දායක මුදල නියෝජනය කෙරෙන යම් ප්‍රේෂණයක කොටස් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත හිමිකම් පෑමක් කරනු ලැබිය හැකි අතර කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ හිමිකම් පෑම සැලකිල්ලට භාජනය කොට ඒ පිළිබඳව තම නියමය කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ කරන ලද කොමසාරිස් ජනරාල්වරයාගේ නියමයකින් අතෘප්තියට පත් සෑම හවුල් ගිණුම් ධාරකයකු ම, ඔහු විසින් කරන ලද දායකවීම්වලට ආරෝපණය කරනු ලැබිය හැකි බවට ඔහු හිමිකම් පා සිටින යම් මුදලක් හෝ ඒ මුදලේ කොටස හෝ අය කර ගැනීම සඳහා ආඥාවක් ඉල්ලමින් දිසා අධිකරණයෙහි නඩු පවරනු ලැබිය හැකිය.

(68 වන අධිකාරය වූ) කාලාපගමන ආඥාපනතේ යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇතද, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට නිකුත් කරන ලද දැන්වීමේ දින සිට මාස තුනක් ඉකුත් වීමෙන් පසු ඒ මුදල හෝ ඒ මුදලේ කොටස හෝ අයකර ගැනීම සඳහා කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය.''.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (6) 35 වන වගන්තියේ සහ 38 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් ව ඇතද, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ කොටස් හිමියා වාසිකයකු වන රටේ ආණ්ඩුව අතර 82 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ගිවිසුමක නිශ්චිත ලාභාංශ මත වූ බදු අනුප්‍රමාණය ඉක්මවමින් වාසික සමාගමක් විසින් නිර්වාසික කොටස් හිමියකුට ගෙවන ලද ලාභාංශයක් සම්බන්ධයෙන් 38 වන වගන්තියට අනුකූලව අඩු කරන ලද යම් බද්දක්, ඒ බද්ද අඩු කරනු ලැබුවේ යම් වර්ෂයක දී ද ඒ වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත නැතහොත් ඒ ගිවිසුම බලාත්මක වූයේ යම් දිනයක දී ද ඒ දින සිට එක් වර්ෂයක් ඇතුළත යන මේ දෙකින් පසුව එළඹෙන කාලය ඇතුළත යථා පරිදි ලියවිල්ලකින් කරන ලද හිමිකම් පෑමක් මත ඒ කොටස් හිමියාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.''.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ '' 92 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 127 වන වගන්තියේ (2) වන උපවගන්තියේ'' යන යෙදුම වෙනුවට '' 92 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 92අඅ වගන්තියේ හෝ 127 වන වගන්තියේ (2) වන උපවගන්තියේ'' යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් අ තුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 158අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

''දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල.

158අ. (1) (මේ වගන්තියේ මින්මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) 1985 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් වර්ෂය වෙනුවෙන් අරමුදලේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන යම් මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) කොමසාරිස් ජනරාල් වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් පනතක් ක්‍රියාත්මක කිරීමෙහි ලා කාර්යක්ෂමතාවය සහතික කරනු පිණිස අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් පංතියකට හෝ වර්ගයකට අයත් නිලධරයන්ට සමූහ දිරි ගැන්වීමේ දීමනා

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් හෝ නියමිත කාර්ය පරිපාටිය අනුකූලව අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ය.''.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) '' බලය ලත් නියෝජිතයා '' යන්නෙහි අර්ථ කථනයේ (2) වන ඡේදයෙහි '' සමාගම් (විගණන) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ පුද්ගලයකුව කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද '' යන වචන වෙනුවට '' තත් කාර්යය සඳහා සාදන ලද නියෝග යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද '' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) '' ව්‍යාපාර '' යන්නෙහි අර්ථකථනයේ '' සමාගමක් විසින් වාණිජමය ස්ථාන කුලියට දීම ඇතුළත් වේ ''; යන වචන වෙනුවට '' සමාගමක් විසින් වාණිජමය කාර්ය සඳහා ස්ථාන කුලියට දීම ඇතුළත් වේ ;'' යන වචන ආදේශ කිරීමෙන්.''.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපලේඛනයේ II අ කොටසේ '' 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා '' යන යෙදුම වෙනුවට '' 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපලේඛනයේ II අ කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"II ආ කොටස

1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

| | | |
|---|---|---|
| බදු අයකළ හැකි ආදායමෙහි පළමුවන රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 7½ |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 10 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 15 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 20 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 25 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 30 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 35 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 40 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 15,000 සම්බන්ධයෙන් | ... | සියයට 45 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 15,000 සම්බන්ධයෙන් | ... | සියයට 50 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් | ... | සියයට 55". |

(ඇ) උපලේඛනයේ IV වන කොටස ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"IV වන කොටස

32 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් සේවා නියුක්තියෙන් ලබන ඇතැම් ලාභවලට අදාළ වියයුතු ආදායම් බද්දෙහි අනුප්‍රමාණ —

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂ සඳහා—

| | | | |
|---|---|---|---|
| පළමුවන රු. 50,000 සම්බන්ධයෙන් | ... | ... | කිසිවක් නැත |
| ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් | ... | ... | සියයට 05 |
| ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් | ... | ... | සියයට 10 |
| ඉතිරි කොටස සම්බන්ධයෙන් | ... | ... | සියයට 15 |

(ආ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

| | | | |
|---|---|---|---|
| පළමුවන රු. 1,00,000 සම්බන්ධයෙන් | ... | ... | කිසිවක් නැත |
| ඊළඟ රු. 50,000 සම්බන්ධයෙන් | ... | ... | සියයට 05 |
| ඊළඟ රු. 50,000 සම්බන්ධයෙන් | ... | ... | සියයට 10 |
| ඉතිරි කොටස සම්බන්ධයෙන් | ... | ... | සියයට 15". |

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ (3) වන විෂය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (3) (අන්තිම කැමති පත්‍ර යටතේ භාරකරුවන් නොවන) පොල්මඃකරුවන් සහ (ඇවරකරුවන් නොවන) දේපළ භාරගන්නෝ—(අන්තිම කැමති පත්‍ර යටතේ භාරකරුවන් නොවන) පොල්මඃකරුවන්ගේ සහ (ඇවරකරුවන් නොවන) දේපළ භාර ගන්නන්ගේ බදු අය කළ හැකි ආදායම—

(i) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් වර්ෂය සඳහා ... ... සියයට 50

(ii) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එළඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා ... ... සියයට 40".

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනයේ (1) වන විෂයය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) පුණ්‍යායතනයක් හෝ ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ ඇති නිර්වාසික සමාගමක් හෝ නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂ පහ සඳහා—

| | |
|---|---|
| බදු අය කළ හැකි ධනයෙන් පළමුවන රු. 2,00,000 සම්බන්ධයෙන් ... | සියයට 1/2 |
| බදු අය කළ හැකි ධනයෙන් ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... | සියයට 3/4 |
| බදු අය කළ හැකි ධනයෙන් ඊළඟ රු. 10,00,000 සම්බන්ධයෙන් ... | සියයට 1 |
| බදු අය කළ හැකි සියලු ධනයෙන් ඉදිරි කොටස සම්බන්ධයෙන් ... | සියයට 2 |

(ආ) 1985 අ ප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

| | |
|---|---|
| බදු අයකළ හැකි ධනයෙන් පළමුවන රු. 5,00,000 සම්බන්ධයෙන් ... | සියයට 1/2 |
| බදු අය කළ හැකි ධනයෙන් ඊළඟ රු. 10,00,000 සම්බන්ධයෙන් ... | සියයට 3/4 |
| බදු අය කළ හැකි ධනයෙන් ඊළඟ රු. 15,00,000 සම්බන්ධයෙන් ... | සියයට 1 |
| බදු අය කළ හැකි සියලු ධනයෙන් ඉතිරි කොටස සම්බන්ධයෙන් ... | සියයට 2.". |

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

**"V වන උප ලේඛනය**

**(51 වන වගන්තිය)**

**ත්‍යාග බද්දෙහි අනු ප්‍රමාණය**

"1අ. 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා පුද්ගලයන් සම්බන්ධයෙන් වන විට :—

| | |
|---|---|
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි පළමුවන රු. 50,000 සම්බන්ධයෙන්... | කිසිවක් නැත |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාවගල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... | සියයට 5 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... | සියයට 10 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... | සියයට 15 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... | සියයට 20 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... | සියයට 25 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... | සියයට 30 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... | සියයට 35 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... | සියයට 40 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... | සියයට 45 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... | සියයට 50 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... | සියයට 55 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... | සියයට 60 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් ... | සියයට 70 |

1ආ. 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයන් සම්බන්ධයෙන් වන විට :—

| | |
|---|---|
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි පළමු වන රු. 2,50,000 සම්බන්ධයෙන් | කිසිවක් නැත |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... | සියයට 5 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... | සියයට 10 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... | සියයට 15 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... | සියයට 20 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... | සියයට 25 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... | සියයට 30 |
| බදු අයකළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... | සියයට 35 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... | සියයට 40 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් | සියයට 45 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් ... | සියයට 50 |

2. සමාගම් සම්බන්ධයෙන් වන විට—

බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමින් සියයට 50.

**36.** ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත් යටතේ පිහිටුවන ලද මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව නිදහස් කරමින් මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

## 1985 අංක 41 දරන බූදල් බදු (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1985 ඔක්තෝබර් මස 22 වන දින]**

එල්. ඩී—ඕ. 13/85.

**1980 අංක 13 දරණ බූදල් බදු පනත සංශෝධනය සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1985 අංක 41 දරන බූදල් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 13 දරන බූදල් බදු පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) (අ) 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව සහ 1984 නොවැම්බර් මස 15 වන දිනට පෙර මියයන යම් තැනැත්තකුගේ බූදලයේ වටිනාකම මත ගෙවිය යුතු බූදල් බදු මුදල, මේ පනතේ උපලේඛනයෙහි I වන කොටසේ සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ආගණනය කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) 1984 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව මියයන යම් තැනැත්තකුගේ බූදලයේ වටිනාකම මත ගෙවිය යුතු බූදල් බදු මුදල, මේ පනතේ උපලේඛනයෙහි II වන කොටසේ සඳහන් උචිත අනුප්‍රමාණය අනුව ආගණනය කරනු ලැබිය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"එක් පදිංචි ස්ථානයක් නිදහස් කිරිම

11. (1) 1984 නොවැම්බර් මස 15 වන දිනට පෙර යම් තැනැත්තකු මියයාමේදී උරුම වන දේපළට යම් නිවාස ස්ථාන කිසිවක් ඇතුළත් වන අවස්ථාවකදී, ඒ නිවාස ස්ථානවලින් එකක වටිනාකම රුපියල් තුන් ලක්ෂයකට සමාන වන්නේ නම්, නැතහොත් එය ඉක්මවන්නේ නම් ඒ එක් නිවාස ස්ථානයක වටිනාකමින් රුපියල් තුන් ලක්ෂයක මුදලක් හෝ, ඒ නිවාස ස්ථානයේ වටිනාකම රුපියල් තුන් ලක්ෂයක් නොඉක්මවන්නේ නම්, ඒ නිවාස ස්ථානයේ වටිනාකම, බූදල් බද්ද ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය ;

(2) 1984 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසුව යම් තැනැත්තකු මියයාමේ දී උරුම වන දේපළට යම් නිවාස ස්ථානයක් ඇතුළත් වන අවස්ථාවක දී ඒ නිවාස ස්ථානවලින් එකක වටිනාකම බූදල් බද්ද ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"විදේශීය බූදල් බදු සම්බන්ධයෙන් සහන

19. මියගිය තැනැත්තාගේ බූදලයෙන් කොටසක් වන දේපළ විදේශීය රටක පිහිටා ඇත්තා වූ ද, මියගිය තැනැත්තාගේ මරණයේ දී ඒ දේපළ සම්බන්ධයෙන් ඒ රටේ දී යම් බූදල් බද්දක් ගෙවිය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන්නා වූ ද අවස්ථාවක, ඔහු විසින්—

(i) 1984 නොවැම්බර් මස 15 වන දිනට පෙර මියයන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ දේපළෙහි වටිනාකම තීරණය කිරීමේදී—

(අ) ඒ රටේ දී ගෙවිය යුතු බූදල් බදු මුදල ; හෝ

(ආ) ඒ බූදලයේ වටිනාකම අනුව මේ පනත යටතේ ගෙවිය යුතු බූදල් බද්දෙන්, ඒ රටේ පිහිටි දේපළෙහි වටිනාකම, බූදලයේ වටිනාකමට දරන අනුපාතයට සමාන වන්නා වූ අනුපාතයකට වූ බූදල් බදු ප්‍රමාණය

යන දෙකින් කවර වූ අඩු ප්‍රමාණයට සමාන වන මුදලක් අඩු කිරීමට ඉඩ දෙනු ලැබිය යුතුය;

(ii) 1984 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසුව මියයන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට—

(අ) ඒ විදේශීය රටේ දී ගෙවිය යුතු බූදල් බදු මුදල ; හෝ

(ආ) 3 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට නිශ්චය කරනු ලබන, ඒ දේපළ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දී ගෙවිය යුතු බූදල් බදු මුදල බද්දේ මුදල් ප්‍රමාණය

යන දෙකින් කවර වූ අඩු ප්‍රමාණයට සමාන වන මුදලක් මේ පනත යටතේ ගෙවිය යුතු බූදල් බදු මුදලින් අඩු කරනු ලැබිය යුතුය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (3) තමා දන්නා වූ සහ මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ සැපයීමට නියම කරනු ලැබුවා වූ, මියගිය තැනැත්තකුගේ බූදලයට අදාළ යම් විස්තර පිළිබඳ වාර්තාවක් දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත සපයන ලෙස නියම කරමින් තක්සේරුකරුවකු විසින් යම් තැනැත්තකුට ලිඛිත දැන්වීමක් දෙනු ලැබිය හැකි ය.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි " ලැබෙන " යන වචනය වෙනුවට " ලැබිය යුතු " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ '' අඩකට '' යන වචනය වෙනුවට '' රුපියල් විසිදහසකට '' යන වචන ආදේශ කිරීමෙන්.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (4) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් යවනු ලැබූ යම් තැනැත්තකුට, බූදලය වෙනුවෙන් යම් මුදලක් නොදැරීමේ හෝ බූදලයට යම් ණයක් ඔහුගෙන් අයවීමට නොතිබීමේ හෝ බූදලයට අය විය යුතු යම් ණයක් ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත අය විය යුතුව නොතිබීමේ හේතුවෙන් ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වන්නා වූ ඒ තැනැත්තා විසින්, ඒ දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත් කරුණු සම්බන්ධයෙන් දැනුම් දෙමින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශයක් කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ දෙනු ලබන දැන්වීමක් මගින් ගෙවීමට නියම කරනු ලබන යම් මුදලක් ඒ දැන්වීමට අනුකූලව ගෙවනු නොලබන්නා වූ සහ (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ඒ දැන්වීමට අදාළ වූ ප්‍රකාශයක් කරනු නොලබන්නා වූ අවස්ථාවක, ඒ මුදල, ඒ දැන්වීම දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගෙන් අයවිය යුතු බූදල් බද්දක් සේ සහ ඒ බූදල් බද්ද පැහැර හරිනු ලැබුයේ ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු ය.''.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියේ '' භාරකරු '' යන වචනය යෙදෙන කවර විටක වුවද '' භාරකරු වශයෙන් හෝ අන්‍යාකාර වූ තත්ත්වයකින් '' යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ '' 26 වන වගන්තිය හෝ 49 වන වගන්තිය '' යන ඉලක්කම් සහ වචන වෙනුවට '' 24 වන වගන්තිය හෝ 26 වන වගන්තිය හෝ 49 වන වගන්තිය '' යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (1) වන උපවගන්තිය, පහත දක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) '' බලයලත් නියෝජිතයා '' යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'' බලයලත් නියෝජිතයා '' යන්න, බූදල් බද්ද ගෙවීමට යටත් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදුන විට ඉන්—

(අ) මේ පනතේ කාර්ය සඳහා තම වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ සහ—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයකු ; හෝ

(ii) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ගණකාධිකාරීවරයකු ; හෝ

(iii) නීතිඥවරයකු ; හෝ

(vi) ඒ තැනැත්තා විසින් නිත්‍ය වශයෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන සේවානියුක්තයකු ; හෝ

(v) ඒ තැනැත්තාගේ ඥාතිවරයකු

වන යම් පුද්ගලයෙක් අදහස් වේ ;

(ආ) මේ පනතේ කාර්යය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු විසින් බලය දීමේ ලියවිල්ලෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් කලින් කල බලය දෙනු ලැබුවා වූ සහ තත්කාර්යය සඳහා සාදන ලද නියෝග යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ පුද්ගලයෙක් අදහස් වේ. ;

(2) '' කොමසාරිස් ජනරාල්වරයා '' යන්නෙහි අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'' කොමසාරිස් ජනරාල්වරයා '' යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද හෝ පත් කරනු ලැබූ ලෙස සලකනු ලබන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර, කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් ක්‍රියා කිරීමට සාමාන්‍යයෙන් හෝ යම් නිශ්චිත කාර්යයක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ කොමසාරිස්-වරයෙක් සහ නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් ඊට ඇතුළත් වේ.''.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

''උපලේඛනය

I වන කොටස

| I වන තීරය (මුදලයේ වටිනාකම) | II වන තීරය (බදු අනුප්‍රමාණය) |
|---|---|
| මුදලයේ වටිනාකමෙන් පළමුවන රු. 100,000 සඳහා ... ... | කිසිවක් නැත |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 100,000 සඳහා ... ... | සියයට 5 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 100,000 සඳහා ... ... | සියයට 10 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 100,000 සඳහා ... ... | සියයට 15 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 100,000 සඳහා ... ... | සියයට 20 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 100,000 සඳහා ... ... | සියයට 25 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 200,000 සඳහා ... ... | සියයට 30 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 200,000 සඳහා ... ... | සියයට 35 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 200,000 සඳහා ... ... | සියයට 40 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 200,000 සඳහා ... ... | සියයට 45 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 200,000 සඳහා ... ... | සියයට 50 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 300,000 සඳහා ... ... | සියයට 55 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 500,000 සඳහා ... ... | සියයට 60 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 500,000 සඳහා ... ... | සියයට 65 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ ඉතිරි කොටස සඳහා ... | සියයට 70 |

## II වන කොටස

### මුදල් බද්ද

| I වන තීරය (මුදලයේ වටිනාකම) | | IIවන තීරය (බදු අනුප්‍රමාණය) |
|---|---|---|
| මුදලයේ වටිනාකමෙන් පළමුවන රු. 250,000 | ... ... | කිසිවක් නැත |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 250,000 | ... ... | සියයට 5 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 250,000 | ... ... | සියයට 10 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 250,000 | ... ... | සියයට 15 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 250,000 | ... ... | සියයට 20 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 250,000 | ... ... | සියයට 25 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 500,000 | ... ... | සියයට 30 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 500,000 | ... ... | සියයට 35 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 500,000 | ... ... | සියයට 40 |
| මුදලයේ වටිනාකමෙන් ඊළඟ රු. 500,000 | ... ... | සියයට 45 |
| මුදලයේ වටිනාකමෙන් ඉතිරි කොටස සඳහා | ... ... | සියයට 50''. |

## 1985 අංක 47 දරන විසර්ජන පනත

**[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 27 වන දින]**

**1986 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1985 අංක 47 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි '' 1986 මුදල් වර්ෂය '' යනුවෙන් සඳහන් කරනු ලබන 1986 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භව 1986 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් පන්දහස් හැටඅටකෝටි පන්ලක්ෂ හැත්තෑපන්දහසක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් ; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් දෙදහස් අටසිය තුන්කෝටි හැට ලක්ෂයක් නොඉක්මවනසේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකා-වෙන් හෝ පිටරටින් හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතු ය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් පන්දහස් හැටඅටකෝටි පන්ලක්ෂ හැත්තෑපන්දහසක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතු ය.

3. (1) 1986 මුදල් වර්ෂය තුළ දී, මේ පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැරකරනු ලැබූ ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ IIIවන තීරයේ අනුරූප සටහනෙහි දක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම් එය 1986 මුදල් වර්ෂය අවසන්වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිගමනය කිරීමේ කාර්යය සඳහා පහත දක්වෙන ගෙවීම්, එනම් :—

(අ) කිසියම් කටයුත්තක ආදායමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපළ වෙනුවෙන් ක්ෂයවීම් ආවරණය සඳහා ප්‍රතිපාදන

එක් එක් කටයුත්තක ආදායමින් අඩු කළ යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1986 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම්, ඒ මුදල් වර්ෂය තුළ දී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 1986 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තවද , ඒ මුදල් වර්ෂයේ අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම්, එම උප ලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

4. 1986 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උප ලේඛනයේ I වන තීරයෙහි දක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි හෝ වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකි ය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

**5.** (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් කිසියම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම්කිසි වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්ද වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද යම් මුදලක් එම වැඩ සටහනේම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන්කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරුකරනු නොලැබිය යුතු ය.

**6.** (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල් වලට වඩා අඩුවිය හැකි බවට ; හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමකට පත්වූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ඉවත් කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

**7.** අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව—

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරුයෙහි, IV වන තීරුයෙහි සහ V වන තීරුයෙහි දක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක් ;

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරුයෙහි දක්වෙන අවම සීමා

නියමයක් මඟින් 1987 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර හෝ වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මුතියක් මඟින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතු ය.

එවැනි කිසියම් නියමයක්, එහි එසේ ප්‍රකාශිතව සඳහන් කරනු ලැබුවහොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් සහ එහි දක්වනු ලබන දිනයක සිට බලපැවැත්වූ ලෙස සැලකිය යුතු ය.

**8.** පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මඟින්, මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ—

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් ;

(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව

එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.

# 1985 අංක 52 දරන මුදල් නීති (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 31 වන දින]**

එල්. ඩී.—ඕ. 41/83

## මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

**1.** මේ පනත 1985 අංක 52 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** මෙහි මින්මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය '' යනුවෙන් සඳහන් කරනු ලබන මුදල් නීති පනතෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක '' ලංකා මහ බැංකුව '' යන වචන වෙනුවට '' ශ්‍රී ලංකා මහ බැංකුව '' යන වචන ආදේශ කරනු ලැබිය යුතු අතර, ඒ අනුව, ප්‍රධාන ප්‍රඥප්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ මඟින් නැතහොත් ඒ යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද හෝ බලය දෙන ලද යම් දන්වීමක, නිවේදනයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක සඳහන් කරන ලද සෑම පද සම්බන්ධයක ම ''ලංකා මහ බැංකුව'' යන වචන වෙනුවට '' ශ්‍රී ලංකා මහ බැංකුව '' යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා ; සහ'',

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

''මහ බැංකුවේ අධිපති වශයෙන් හෝ මුදල් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කිරීම සඳහා නුසුදුසුකම්.

11. (1) යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම්, නැතහොත් යම් පළාත් පාලන ආයතනයක සභිකයෙක් නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූලව රජයේ නිලධරයෙක් හෝ අධිකරණ නිලධරයෙක් නම්, හෝ මහජන අරමුදල් වලින් හෝ යම් පළාත් පාලන ආයතනයක අරමුදල්වලින් වැටුප හෝ වෙනත් පාරිශ්‍රමික ගෙවනු ලබන, තෝරා පත්කර ගැනීමෙන් හෝ පත් කිරීමෙන් (ශාස්ත්‍රීය නොවන) ධුරයක් හෝ තත්ත්වයක් දරන්නෙක් නම් ; හෝ

(ඇ) (මහ බැංකුව නොවන) යම් බැංකු ආයතනයක අධ්‍යක්ෂවරයෙක් නිලධරයෙක්, සේවා නියුක්තයෙක් හෝ කොටස් හිමියෙක් නම්,

ඒ තැනැත්තා මහ බැංකුවේ අධිපති වශයෙන් පත් කිරීම සඳහා නුසුදුස්සෙක් වන්නේ ය.

(2) යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම් නැතහොත් යම් පළාත් පාලන ආයතනයක සභිකයෙක් නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූලව රජයේ නිලධරයෙක් හෝ අධිකරණ නිලධරයෙක් නම්, හෝ මහජන අරමුදල්වලින් හෝ යම් පළාත් පාලන ආයතනයක අරමුදල්වලින් ගෙවනු ලබන, වැටුපක් හෝ වෙනත් පාරිශ්‍රමිකයක් ලබන, තෝරා පත්කර ගැනීමෙන් හෝ පත් කිරීමෙන් (ශාස්ත්‍රීය තත්ත්වයක් නොවූ) ධුරයක් හෝ තත්ත්වයක් දරන්නෙක් නම් ; හෝ

(ඇ) (මහ බැංකුව නොවන) යම් බැංකු ආයතනයක අධ්‍යක්ෂවරයෙක්, නිලධරයෙක්, සේවා නියුක්තයෙක් හෝ කොටස් හිමියෙක් නම්

ඒ තැනැත්තා 8 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මුදල් මණ්ඩලයේ සාමාජිකයෙක් වශයෙන් පත්කිරීම සඳහා නුසුදුස්සෙක් වන්නේ ය.''.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් මහ බැංකුවේ අධිපති පත් කරනු ලැබිය යුතු ය.''

(2) එහි (2) වන උපවගන්තියේ අතුරු වගන්තියෙහි ''යම් ශාස්ත්‍රීය ධුරයක් හෝ තත්ත්වයක් භාර ගැනීමෙන් හෝ දැරීමෙන්'' යන වචන වෙනුවට, ''යම් ශාස්ත්‍රීය ධුරයක් හෝ තනතුරක් නැතහොත්, ආර්ථික විද්‍යා, මූල්‍ය, බැංකු ක්‍රම, සංඛ්‍යාලේඛන සහ මුදල් විෂයයන් පිළිබඳව පර්යේෂණ කරගෙන යාමේ කාර්යය සඳහා පිහිටුවන ලද යම් ආයතනයක හෝ සංවිධානයක යම් ධුරයක් හෝ තත්ත්වයක් භාර ගැනීමෙන් හෝ දැරීමෙන්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන යම් වැටුපක් අධිපති විසින් ලැබිය යුතු ය.''.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියෙහි, 24අ වගන්තිය වශයෙන් බලපැවැත් විය යුතු ය :—

24අ. (1) යම් තැනැත්තකුට නියෝජ්‍ය අධිපතිවරයකු විසින්—

''තොරතුරු ලබා ගැනීම සඳහා නියෝජ්‍ය අධිපතිවරයා සතු අධිකාරය.

(අ) මහ බැංකුවේ කර්තව්‍ය සහ වගකීම් නිසිපරිදි ඉටු කිරීමේ කාර්යය සඳහා ලබා ගැනීම අවශ්‍ය යයි තමා විසින් සලකනු ලබන යම් තොරතුරු, තමා විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් ඇතුළත සහ යම් ආකාරයකට තමා වෙත හෝ තමා විසින් නම් කරනු ලබන මහ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත සපයන ලෙස ; හෝ

(ආ) තමා විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් ඇතුළත සහ යම් ආකාරයකට තමා වෙත නැතහොත් තමා විසින් නම් කරනු ලබන මහ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත, ඒ තැනැත්තා සන්තකයෙහි ඇති, මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් තොරතුරු ඇතුළත් හෝ ඇතුළත් වී තිබිය හැකි පොත් හෝ වාර්තා පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස

නියම කරනු ලැබිය හැකි ය.

(2) යුක්ති සහගත හේතුවක් නොමැතිව (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයන්ට අනුව කටයුතු කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

(3) මේ වගන්තියේ '' තැනැත්තා '' යන්නට, ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක යම් නිලධරයකු සහ, යම් ලිඛිත නීතියක් යටතේ හෝ අන්‍යාකාරයකින් පිහිටුවන ලද්ද වූ සංස්ථාපනය කරන ලද්ද වූ හෝ යම් සංස්ථාගත හෝ සංස්ථාගත කරනු නොලැබූ යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.''

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 29අ සහ 29ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතුය :—

බැංකු ආයතන නොකඩවා අධීක්ෂණය කිරීම.

29අ. බැංකු ආයතන නොකඩවා අධීක්ෂණය කිරීමේ කාර්යය සඳහා, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්—

(අ) කලින් කල සහ තමා විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, යම් වාණිජ බැංකුවක හෝ මුදල් මණ්ඩලය විසින් එසේ බලය දෙනු ලැබ ඇත්නම්, වාණිජ බැංකුවක් නොවන යම් බැංකු ආයතනයක ව්‍යාපාර හෝ කටයුතු වලට අදාළ සත්‍ය තත්ත්වය නිශ්චය කරගැනීමේ කාර්යය සඳහා ලබා ගැනීමට අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන ප්‍රකාශයක් හෝ තොරතුරු සපයන ලෙස ඒ වාණිජ බැංකුවකට හෝ බැංකු ආයතනයකට නියම කරනු ලැබිය හැකිය ;

(ආ) යම් වාණිජ බැංකුවක විගණකවරයකුට හෝ මුදල් මණ්ඩලය විසින් එසේ බලය දෙනු ලැබ ඇත්නම්, වාණිජ බැංකුවක් නොවන යම් බැංකු ආයතනයක විගණකවරයකුට (අ) වන ඡේදයෙහි

සඳහන් කාර්යය සඳහා ලබා ගැනීමට අවශ්‍ය යයි තමා විසින් සලකනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ වාණිජ බැංකුවේ හෝ බැංකු ආයතනයේ විගණකවරයා විසින් කරනු ලැබූ විගණනයක් සම්බන්ධයෙන් වූ යම් තොරතුරක් තමා විසින් නිශ්චය කරනු ලබන යම් කාල සීමාවක් ඇතුළත තමා වෙත සපයන ලෙස නියම කරනු ලැබිය හැකිය ; තව ද

(ඈ) යම් වාණිජ බැංකුවක් හෝ වෙනත් බැංකු ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද, එසේ සපයනු ලැබූ යම් ප්‍රකාශයක හෝ තොරතුරක නිරවද්‍යතාව සත්‍යාක්ෂණය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන්නා වූ ද පොත් සහ ගිණුම් ඔහු විසින් පරීක්ෂා කළ හැකි ය. නැතහොත් ඔහුගේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයෙකු ලවා ඒවා පරීක්ෂා කරවීමට සලස්වනු ලැබිය හැකි ය.

29ආ. (1) යම් වාණිජ බැංකුවකට අයත් යම් පාලිත ආයතනයක හෝ නියෝජ්‍යායතනයක පොත් සහ ගිණුම් හෝ මුදල් මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා විධාන දෙනු ලැබ ඇත්නම්, වාණිජ බැංකුවක් නොවන බැංකු ආයතනයකට අයත් යම් පාලිත ආයතනයක හෝ නියෝජ්‍යායතනයක පොත් සහ ගිණුම් හෝ අධිපති විසින් තත් කාර්යය සඳහා විධාන දෙනු ලැබ ඇත්නම්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද බැංකු ව්‍යාපාරය කරගෙන යන සමිතියක පොත් සහ ගිණුම් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු ය. නැතහොත් ස්වකීය දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකු විසින් පරීක්ෂා කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 29 වන වගන්තියේ (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවල සහ 30 වන, 31 වන සහ 32 වන වගන්තිවල විධිවිධාන, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් ආයතන සියල්ලටම හෝ ඉන් යම් ආයතනයකට හෝ ඒවා සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.''.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (3) වන උපවගන්තියේ—

(අ) ''දින තිහක කාලයක් ඉකුත් වූ විට'' යන වචන වෙනුවට ''මාස හයක කාලයක් ඉකුත් වූ විට'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (ආ) ඡේදයේ ''ඉල්ලීමක් කිරීමට සැලැස්වීම'' යන වචන වෙනුවට ''ඉල්ලීමක් කිරීමට සැලැස්වීම හෝ'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්—

''(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ ආයතනයක ශාඛාවක කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා, නිසි අධිකරණ බලය ඇති අධිකරණය වෙත බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා ලවා ඉල්ලීමක් කිරීමට සැලැස්වීම ;'' සහ

(2) එහි (9) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

''(9) බැංකු ආයතනයක ව්‍යාපාරය (1) වන උපවගන්තිය යටතේ අත්හිටුවනු ලැබ ඇති අවස්ථාවක, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්—

(අ) ඒ බැංකු ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍ය යයි මුදල් මණ්ඩලය විසින් සලකනු ලබන යම් ක්‍රියා මාර්ගයක් නොපමාවම ගැනීමට හෝ යම් ක්‍රියාවක් හෝ දෙයක් නොපමාව කිරීමට හෝ ඒ බැංකු ආයතනයට නියම කරනු ලැබිය හැකි ය ;

(ආ) ඒ බැංකු ආයතනයේ ව්‍යාපාරය නිසි ලෙස පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ඒ බැංකු ආයතනයට උපදෙස් දීමට සුදුසු හා නිසි තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය ;

(ඇ) ඒ බැංකු ආයතනයේ පාලනය භාර ගනු ලැබ එහි ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි ය ; නැතහොත් බැංකු ආයතනයේ ව්‍යාපාරය කරගෙන යාම වෙනත් තැනැත්තකුට පවරනු ලැබිය හැකි ය ;

(ඈ) ඒ බැංකු ආයතනයේ ප්‍රාග්ධනය වැඩි කිරීමෙන් සහ අලුත් කොටස් හිමියන් බඳවා ගැනීමට කටයුතු සංවිධානය කිරීමෙන් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය පුනස්ථාපනය කිරීමෙන් එය ප්‍රතිසංවිධානය කරනු ලැබිය හැකි ය ; තව ද

(ඉ) ඒකාබද්ධවීමට කැමැත්තක් දක්වන්නා වූ වෙනත් යම් බැංකු ආයතනයක් සමග ඒ බැංකු ආයතනය ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කරනු ලැබිය හැකි ය ;

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇ වගන්තියේ (2) වන උපවගන්තියේ ''29 වන වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්තිවල සහ, 30 වන වගන්තියෙහි'' යන ඉලක්කම් සහ වචන වෙනුවට ''20 වන වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්තිවල 20අ වගන්තියේ (ආ) ඡේදයේ, 30 වන වගන්තියෙහි'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (1) ශ්‍රී ලංකා මහ බැංකුවේ සෑම නිලධරයකු ම සහ සේවකයකු ම විසින් මේ පනත යටතේ හෝ 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය කිරීමේ පනත යටතේ හෝ තත් කාලයෙහි බල පවත්නා වෙනත් යම් නීතියක් යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැනගන්නට ලැබෙන පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් එනම්, යම් බැංකු ආයතනයක හෝ එවැනි යම් ආයතනයක යම් සේවා දායකයකුගේ හෝ කටයුතුවලට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් හෝ, ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, සමාගමක, හවුල් ව්‍යාපාරයක හෝ තැනැත්තකුගේ කටයුතුවලට අදළ යම් කාරණයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේදී හැර, රහස්‍යභාවය රැකිය යුතු අතර, එලෙස රහස්‍යභාවය රැකීමෙහි ලා ආධාර කළ යුතු ය. තව ද මුදල් මණ්ඩලයට හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ මහ බැංකුවේ නිලධරයකුට හැර වෙනත් යම් තැනැත්තකුට එවැනි යම් කාරණයක් දක්වන හෝ, යම් බැංකු ආයතනයකට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ තැනැත්තකුට අදළ පොත්, ලිපි හෝ වෙනත් වාර්තා කිසිවක් කියවා බැලීමට බලය නොලත් යම් තැනැත්තකුට ඉඩ දෙන හෝ අවසර දෙන යම් නිලධරයෙක් හෝ සේවකයෙක් වරදකට වරදකරු වන්නේ ය.''.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ව්‍යවහාර මුදල් පිළිබඳ අර්ථකථනය.

48. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ කාර්ය සඳහා "ව්‍යවහාර මුදල්" යන්නෙන්, මේ පනතේ විධිවිධාන වලට අනුකූලව නිකුත් කරන ලද හෝ සංසරණය වන සියලුම මුදල් නෝට්ටු සහ කාසි අදහස් වේ.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) එහි (ආ) ඡේදයෙහි අවසානයට යෙදී ඇති "ව්‍යවහාර මුදල් නෝට්ටු, හෝ" යනවචන වෙනුවට "ව්‍යවහාර මුදල් නෝට්ටු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) එහි (ඇ) ඡේදයෙහි "දන්වීමක ආකෘතියෙහි වූ කිසිවක් අමුණා හෝ අලවන" යන වචන වෙනුවට "දන්වීමක ආකෘතියෙහි වූ කිසිවක් අමුණා හෝ අලවන, හෝ " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(iii) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඈ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක කවරාකාර වූ හෝ පිටපතක් නිපදවන හෝ ප්‍රතිරූපයක් සඳහා,".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියේ (3) වන උපවගන්තියේ " පහත දැක්වෙන ආකෘතියෙහි විය යුතු ය :—" යන වචන වෙනුවට, "පහත දැක්වෙන ආකෘතියට සාරානුකූල විය යුතු ය :—" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ " පහත දැක්වෙන ආකෘතියෙහි විය යුතු ය :—" යන වචන වෙනුවට, " පහත දැක්වෙන ආකෘතියට සාරානුකූල විය යුතු ය :—" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"යම් වාණිජ බැංකුවක සංචිතවල ඌනතා මත පොළිය ගෙවීම.

97. (1) යම් වාණිජ බැංකුවක සංචිත, 96 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ආගණනය කරනු ලබන නියමිත සංචිතවලට වඩා පහළින් පවත්නා කවර විටක වුවද, ඌනතා මුදල මත වූ පොලිය මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලබන පරිදි එක් දිනකට සියයට එකෙන් දහයෙන් එකක් නොඉක්මවන අනු ප්‍රමාණයන් අනුව, මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් කාලයක් ඇතුළත බැංකුව විසින් මහ බැංකුවට ගෙවනු ලැබිය යුතුය;

එසේ වුව ද යම් සතියක දින හතෙන් එක් එක් දිනයෙහි ව්‍යාපාර කටයුතු අවසානයේ දී මහ බැංකුව සමග යම් වාණිජ බැංකුවක බැරට පවත්නා මුදලේ සමස්තය, ඉහතින් වූ වගන්ති අනුව කටයුතු කිරීම සඳහා, එම සතියේ දින හතෙන් එක් එක් දිනයෙහි එම බැංකුව විසින් අවමයක් වශයෙන් පවත්වාගෙන යා යුතුව තිබුණු සංචිතවල සමස්තයට අඩු නොවන්නේ නම්,

ඒ සතියේ එක් දිනයක දී හෝ ඊට වැඩි දින ගණනක දී උද්ගතවන සංචිතවල යම් ඌනතාවක් සම්බන්ධයෙන් පොලිය ගෙවීමට වාණිජ බැංකුවකට නියම කරනු නොලැබිය යුතු ය. මුලින් සඳහන් කළ සමස්තය පසුව සඳහන් කළ සමස්තයට අඩුවන අවස්ථාවක, මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලබන අනුප්‍රමාණය අනුව වූ පොලියක් ඒ ඌනතාව මත ගෙවිය යුතු අතර, එකී පොලිය ඒ සමස්ත දෙකෙහි වෙනසින් හතෙන් එකකට (සතියකින් යම් භාගයක් ගණන් නොගෙන) සමාන මුදලක් විය යුතු ය. තව ද එසේ ආගණනය කරනු ලැබූ ඌනතාව මත වූ පොලිය සතියේ දින හතෙන් සෑම දිනකදී ම ඒ ඌනතාව සිදුවූයේ ය යන පදනම මත ගෙවිය යුතු අතර, ඒ ගෙවීම් මේ උපවගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රමාණවත් ලෙස ඉටු කිරීමක් වන්නේය.

(2) නියමිත සංචිත පවත්වා ගෙන යාම යම් බැංකුවක් විසින් නොකඩවා පැහැර හරිනු ලබන අවස්ථාවක—

(අ) (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ඒ බැංකුවට අදාළ නොවිය යුතු බවට ;

(ආ) (i) ඒ බැංකුව විසින් අලුත් ණයදීම හෝ ආයෝජනය කිරීම තහනම් කරමින් හෝ සීමා කරමින් ; සහ

(ii) ස්වකීය කොටස් හිමියන්ට ලාභාංශයක් ගෙවීමේ කාර්යය සඳහා ඒ බැංකුවේ සම්පූර්ණ ශුද්ධ ලාභය හෝ ඉන් යම් නිශ්චිත කොටසක් යොදා ගැනීම තහනම් කරමින්

මුදල් මණ්ඩලය විසින් නියමයක් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "සතිය" යන්නෙන්, මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් අනුගාමී දින හතක් අදහස් වේ."

## 1985 අංක 53 දරන බූදල් බදු (ඉවත් කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 31 වන දින]**

**1985 නොවැම්බර් මස 13 වන දින හෝ ඉන් පසුව මිය යන තැනැත්තන්ගේ බූදලය මත, 1980 අංක 13 දරන බූදල් බදු පනත යටතේ බූදල් බද්ද අයකිරීම සහ ගෙවීම ඉවත් කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1985 අංක 53 දරන බූදල් බදු (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 1985 නොවැම්බර් මස 13 වන දින හෝ ඉන් පසුව මිය යන යම් තැනැත්තකුගේ බූදලයේ වටිනාකම මත, 1980 අංක 13 දරන බූදල් බදු පනත යටතේ කිසිම බූදල් බද්දක් අය කිරීම හෝ ගෙවීම නොකළ යුතු ය.

## 1985 අංක 54 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 31 වන දින]

1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1985 අංක 54 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 21 වන වගන්තියේ "අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ අවස්ථාවක" යන වචන සිට "ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය." යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ස්වකීය වාර්තාවේ පිරිවැටුම එළිදරව් කිරීමේ දී හෝ ඒ පිරිවැටුම් සම්බන්ධ පිරිවැටුම් බදු අනුප්‍රමාණය අදාළ කිරීමේ දී හෝ වංචාවක් හෝ ඕනෑකමින් ම පැහැර හැරීමක් සිදු වී නොමැති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි සනාථ කරනු ලබන්නේ නම් මිස, සාවද්‍ය වාර්තාවක් පිළියෙල කිරීම සඳහා හෝ තම වාර්තාවෙහි දක්වා ඇති පිරිවැටුමට සම්බන්ධ සාවද්‍ය පිරිවැටුම් බදු අනුප්‍රමාණයක් අදළ කිරීම සඳහා දණ්ඩනය වශයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන මුදලක් හා තක්සේරුවෙන් හිමිකම් පා සිටින මුළු පිරිවැටුම් බද්ද සහ වාර්තාව මත ගෙවනු ලබන පිරිවැටුම් බද්ද අතර ඇති වෙනස මෙන් දෙගුණයකට සමාන මුදලක් ගෙවන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලක් මගින් නියම කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(6) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ මේ පනත සාධාරණ ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අවශ්‍යතාව කෙරෙහි සැලකිල්ල ඇතිව, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන්—

(අ) ඒ ප්‍රදේශයේ පිරිවැටුම් බදු ගෙවන්නන්ගේ නම් සහ ලිපිනයන් ;

(ආ) ඒ එක් එක් බදුගෙවන්නා විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරය පිළිබඳ විස්තරයක් ; සහ

(ඇ) කාර්තුවක් සඳහා ඒ එක් එක් පිරිවැටුම් බදු ගෙවන්නා විසින් ප්‍රකාශිත පිරිවැටුම

ඇතුළත් ලැයිස්තුවක්, අවස්ථානුකූල යයි කොමසාරිස් ජනරාල් වරයා විසින් සලකනු ලබන ආකාරයකින් පළ කරනු ලැබීමට සැලැස්විය හැකි ය."

## 1985 අංක 55 දරන විසර්ජන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 31 වන දින]

1984 අංක 46 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1985 අංක 55 දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1984 අංක 46 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "රුපියල් දෙදහස් දෙසිය පනස්තුන්කෝටි අනූලක්ෂයක්" යන වචන වෙනුවට, "රුපියල් දෙදහස් අටසිය කෝටියක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

# 1985 අංක 56 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 31 වන දින.]

**1979 අංක 28 දරණ දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1985 අංක 56 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ :—

**2.** (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ " නිල පඩි නඩි " යන වචන සිට "සේවා නියුක්තියෙන් ලැබුණු යම් ලාභ ;" යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(viii) 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක සේවා නියුක්තයකුගේ

නිල පඩි නඩි සහ යම් තැනැත්තකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් (i) වන, (ii) වන, (iii) වන, (iv) වන, (v) වන, (vi) වන හෝ (viii) වන විෂයයන්හි සඳහන් නිලධරයකු හෝ සේවා නියුක්තයකු වශයෙන් මේ පනත ආරම්භ වීමට පෙර හෝ පසුව හෝ වුවද ඉටුකරන ලද ඉකුත් සේවා සම්බන්ධයෙන් ඒ තැනැත්තාට ලැබුණු 4 වන වගන්තියෙහි (ඇ) ඡේදයෙහි සඳහන් යම් විශ්‍රාම වැටුපක් හෝ සේවා නියුක්තියෙන් ලැබුණු යම් ලාභ;".

(2) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ (i) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(I) (අ) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1986 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී රුපියල් තිස් දහසක්, සහ

(ආ) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී රුපියල් හතළිස් දෙදහසක්

නොඉක්මවන්නා වූ සේවා නියුක්තියෙන් ලබන ලාභ සහ ආදායමෙන් ; සහ ".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ඌ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඌඌ) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්:—

(i) (165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව ; හෝ

(ii) 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව

විසින් බොල් ණය හෝ සැක සහිත ණය සම්බන්ධයෙන් විශේෂ සංචිතයකට පවරන ලද ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ස්වකීය ලාභවලින් සහ ආදායමෙන් සියයට හතළිහක් නොඉක්මවන යම් මුදලක්. '' ;

(2) ඒ උපවගන්තියේ (ට) ඡේදයේ '' ඒ තැනැත්තා විසින් දරන ලද වියදම්.'' යන වචන වෙනුවට ''ඒ තැනැත්තා විසින් දරන ලද වියදම්;'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

''(ඩ) මේ ඡේදයේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබ, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ තම සේවාවන් අවසන්වීම මත සේවානියුක්තයන්ට පාරිතෝෂික ගෙවීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන යම් අරමුදලකට ඒ තැනැත්තා විසින් කරන ලද යම් වාර්ෂික ගෙවීමක්.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ අතුරු වගන්තියේ (ii) වන අනුඡේදයේ ''ව්‍යවස්ථාපිත ආදායමින් අඩුකර ගත යුතුය.'' යන වචන වෙනුවට ''ව්‍යවස්ථාපිත ආදායමින් අඩුකර ගත යුතු ය ; තවද ;'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ අතුරු වගන්තියේ අවසානයට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

'' (iii) 1985 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව අයිතියෙහි වෙනසක් සිදු වී ඇති සමාගමක් විසින් දරන ලද පාඩුවක් සම්බන්ධයෙන් වන විට, ඒ පාඩුව සිදුවූයේ ඒ සමාගමේ යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක ව්‍යවස්ථාපිත ආදායමට ප්‍රතිපක්ෂව නම් හැර, මේ ඡේදය යටතේ හෝ 3 වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ 4 වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ සමාගමේ එවැනි පාඩුවක් සම්බන්ධයෙන් කිසිම අඩුකිරීමක් කරනු නොලැබිය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා පාඩු සිදු වූ තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවක දී සමාගමේ කොටස් ප්‍රාග්ධනය දරනු නොලැබූ තැනැත්තන් විසින්, අඩු කිරීම සඳහා හිමිකම් පෑම කරනු ලබන තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවකදී සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් කෙළින්ම හෝ නාමිකයන් මගින් දරණු ලබන අවස්ථාවක එවැනි සමාගමක අයිතියෙහි වෙනසක් සිදු වී ඇතැයි සලකනු ලැබිය යුතු ය.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ—

(අ) (1) වන උපවගන්තියේ (අඅඅ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අඅඅ) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් විසි හතර දහසක දීමනාවක් ; සහ" ;

(ආ) ඒ උපවගන්තියේ (අඅඅ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අඅඅඅ) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් විසි හත් දහසක දීමනාවක්."
තවද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියෙහි—

(අ) (ඈ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඈ) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් රුපියල් විසි හතර දහසක දීමනාවක් ;"
තවද

(ආ) ඒ අතුරු වගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඉ) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් විසි හත් දහසක දීමනාවක්."

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (i) වන අනුඡේදයේ "ඒ නිවාසයෙහි හෝ බිම් කොටසෙහි අයිතිකරුව සිටින අතරතුර ඒ පුද්ගලයා විසින් ආපසු ගෙවනු ලැබීමේ දී ;" යන වචන වෙනුවට "ඒ නිවාසයෙහි හෝ බිම් කොටසෙහි අයිතිකරුව සිටින අතරතුර හෝ—

(අ) ඒ නිවාසයෙහි හෝ බිම් කොටසෙහි හෝ අයිතිය ඒ පුද්ගලයාගෙන් ත්‍යාගයක ආකාරයෙන් අත්කර ගනු ලැබුවා වූ; සහ

(ආ) මේ පනතේ කාර්යය සඳහා ඒ තක්සේරු වර්ෂයේදී ඒ පුද්ගලයාගේ ආදායම සමග තම ආදායම එකතු කරනු ලැබුවා වූ

වයස අවුරුදු දහ අටට අඩු ඒ පුද්ගලයාගේ ළමයකු ඒ නිවාසයෙහි හෝ බිම් කොටසෙහි හෝ අයිතිකරුව සිටින අතරතුර ඒ පුද්ගලයා විසින් ආපසු ගෙවනු ලැබීමේ දී ."
යනු වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු වගන්තියේ—

(අ) (ආ) ඡේදයෙහි " අඩුකිරීමක් කරනු නොලැබිය යුතුය." යන වචන වෙනුවට " අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය ; තව ද " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ අතුරු වගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

" (ඇ) යම් තක්සේරු වර්ෂයක දී ඒ නිවාසයේ හෝ බිම් කොටසේ අයිතිකරු—

(i) ඒ නිවාසයේ හෝ බිම් කොටසේ හෝ අයිතිය ඒ පුද්ගලයාගෙන් ත්‍යාගයක ආකාරයෙන් අත් කර ගනු ලැබුවා වූ ; සහ

(ii) මේ පනතේ කාර්යය සඳහා ඒ තක්සේරු වර්ෂයේ දී ඒ පුද්ගලයාගේ ආදායම සමග තම ආදායම එකතු කරනු ලැබුවා වූ

වයස අවුරුදු දහ අටට අඩු ඒ පුද්ගලයාගේ ළමයකු වෙතොත්, ඒ තක්සේරු වර්ෂයේ දී ඒ පුද්ගලයා ඒ නිවාසයේ හෝ බිම් කොටසේ හෝ අයිතිකරු නොවුව ද, ඒ සුදුසුකම් ලැබීමේ ගෙවීම සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය වෙනුවෙන් (1) වන උපවගන්තිය යටතේ අඩු කිරීමක් කරනු ලැබිය යුතු ය.".

(3) ඒ වගන්තියේ (5අ) උපවගන්තියේ " 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට " 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (5අ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (5ආ) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම—

(i) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද හෝ කරන ලද්දැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් ගෙවීම් නොවන, සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එක් පංගුවක් හෝ රුපියල් එක් ලක්ෂ පනස් දහසක් යන ප්‍රමාණ දෙකින් වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය ;

(ii) ඔහු විසින් කරන ලද හෝ කරන ලද්දැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් රුපියල් එක් ලක්ෂ පනස් දහසක් නොඉක්මවිය යුතු ය ; තවද

(iii) (i) වන සහ (ii) වන ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලබන සියලු ගෙවීම්වල සමස්තය සම්බන්ධයෙන් රුපියල් එක් ලක්ෂ පනස් දහසක්, නොඉක්මවිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයේ (iv) වන අනුඡේදය ඉවත් කොට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:—

"(iv) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, මේ පනතේ පළමුවන උපලේඛනයේ II ආ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව.";

(ආ) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(v) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්, මේ පනතේ පළමුවන උපලේඛනයේ 2ඇ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව." ; සහ

(ඇ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (iii) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

"(iii) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් විසි හතර දහසක් ; සහ

(iv) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් විසිහත් දහසක්.".

(2) එහි (2) වන උපවගන්තියේ (vi) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

" (iv) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් II ආ කොටසෙහි ; සහ

(v) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් II ඇ කොටසෙහි :

එසේ වුව ද 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායමට කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, ඒ පුද්ගලයාගේ සේවා යෝජක විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ සියලු පුද්ගලයන්ට ඒකාකාරව අදාළ කරනු ලැබිය නොහැකි ක්‍රමයකට අනුකූලව ඒ පුද්ගලයාට ගෙවා ඇත්තා වූ මේ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම් මුදලක් ඇතුළත් වන අවස්ථාවක, ඒ මුදල මේ පනතේ අර්ථානුකූලව ප්‍රාග්ධන ලාභයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, මේ වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගෙන් බදු අය කළ යුතු ය.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ ''යටත් නොවිය යුතුය.' යන වචන වෙනුවට ''යටත් නොවිය යුතුය ;'' යන වචන ආදේශ කිරීමෙන්, තව ද

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ඇ) රාජ්‍ය සංස්ථාවක් වන සමාගමක ඒ තක්සේරු වර්ෂයේ දී බදු ගෙවීමෙන් පසුව, ලාභවලින් සියයට විසි පහකට සමාන මුදලකින් සමන්විත විය යුතු ය.''.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

''ගෙවිය යුතු ධන බද්ද එක්තරා ප්‍රමාණයක් නොඉක්මවිය යුතු බව.

50. යම් තැනැත්තකු විසින්—

(අ) 1979 අප්‍රේල් මස 1 දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ ගෙවිය යුතු ධනබද්ද ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම සහ (මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් නිවාස ස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ යම් සහනාධාරයක් නො වන) මේ පනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් හෝ යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවා වූ ද මේ නිදහස් කිරීම නිසා නොවේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ආගණනය කිරීමේ දී ගණන් ගනු ලබන ලාභ සහ ආදායම් වන්නා වූ ද ලාභවල සහ ආදායමේ සමස්තයෙන් සියයට අසූවක් නො ඉක්ම විය යුතු ය.

(ආ) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ධන බද්ද, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම සහ (මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස්, නිවාස ස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ යම් සහනාධාරයක් නොවන) මේ පනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් හෝ යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවා වූ ද, මේ නිදහස් කිරීම නිසා නොවේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළහැකි ආදායම ආගණනය කිරීමේ දී ගණන් ගනු ලබන ලාභ සහ ආදායම වන්නා වූ ද ලාභවල සහ ආදායමේ සමස්තයෙන් සියයට හැටක් නොඉක්මවිය යුතු ය.''.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

''ත්‍යාග බද්ද අය කිරීම

51. මේ පරිච්ඡේදයේ වෙනත් විධිවිධානවලට යටත්ව, 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1986 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම, 42 වන වගන්තියෙහි සඳහන් පුද්ගලයකු නොවන සෑම පුද්ගලයකුගෙන්ම, සහ සෑම සමාගමකින්ම ඒ පුද්ගලයා හෝ සමාගම විසින් දෙනු ලැබූ බදු අය කළ හැකි ත්‍යාග

සම්බන්ධයෙන් මේ පනතේ මෙහි මින් මතු '' ත්‍යාග බද්ද '' යනුවෙන් සඳහන් කරනු ලබන බද්දක් ඒ තක්සේරු වර්ෂයේ දී හෝ 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1985 නොවැම්බර් මස 13 වන දිනට පෙර හෝ මේ පනතේ පස්වන උපලේඛනයෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව අය කළ යුතු ය.''.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (2) උපවගන්තියේ ''එහෙත් එකී තක්සේරු වර්ෂයේ අවසානයට පෙර'' යන වචන වෙනුවට ''එහෙත් එකී තක්සේරු වර්ෂයේ අවසානයට පෙර හෝ 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වන විට 1985 නොවැම්බර් මස 13 වන දිනට පෙර '' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1අ) උපවගන්තියේ (iii) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(iii) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වුන තක්සේරු වර්ෂය සඳහා රුපියල් විසිහතර දහසක් ; සහ

(iv) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් විසිහත් දහසක්.''.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියේ '' 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන '' යන වචන හා ඉලක්කම් වෙනුවට '' 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1985 මාර්තු මස 31 වන දිනට පෙර ආරම්භ වන'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(2) (අ) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු යටත් වන බද්දේ ; සහ

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා යටත් වන ආදායම් බද්දේ

සමස්තය, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදයමේ සහ (මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් නිවාස ස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ සහනාධාරයක් නොවන) මේ පනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් හෝ යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවා වූ ද, මේ නිදහස් කිරීම නිසා නොවේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම් ආගණනය කිරීමේ දී ගණන් ගනු ලබන ලාභ සහ ආදායම වන්නා වූ ද ලාභවල සහ ආදායමේ සමස්තය සියයට හැටක් ඉක්මවන අවස්ථාවක ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු යටත් වන ධන බද්දට ප්‍රතිපක්ෂව ඒ අතිරික්තය හිලවු කරනු ලැබිය යුතු ය.''.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ආදායම් බදු ගෙවීමට යටත් සෑම සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, මේ පනතේ කාර්ය සඳහා—

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඒ සමාගමේ හෝ හවුල් ව්‍යාපාරයේ හෝ පුද්ගල මණ්ඩලයේ ආදායම පිළිබඳ වාර්තාවෙහි ; සහ

(ආ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන ඒ සියලු ගනුදෙනුවලට අදාළ සියලු ලේඛනවල

අවස්ථාවෝචිත පරිදි ව්‍යාපාර නාම ආඥාපනත යටතේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ඒ සමාගමේ හෝ හවුල් ව්‍යාපාරයේ හෝ පුද්ගල මණ්ඩලයේ ලියාපදිංචි කිරීමේ අංකය දැක්විය යුතු ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ XV වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් පරිච්ඡේදය ඇතුළත් කරනු ලබන අතර, එය එහි XV අ පරිච්ඡේදය වශයෙන් බලපැවැත්විය යුතු ය.

### XVඅ පරිච්ඡේදය

බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවනු ලබන පොලියෙන් ආදායම් බදු අඩුකර ගැනීම.

බැංකු සහ මූල්‍ය ආයතන විසින් ආදායම් බදු අඩු කළ යුතු බව.

113අ. (1) සෑම බැංකුවක් සහ මූල්‍ය ආයතනයක් විසින් ම, මේ පරිච්ඡේදයේ වෙනත් විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ කවර හෝ අවස්ථාවක දී ආදායම් බදු අයකරනු ලැබිය යුතු තැනැත්තකු තමාගේම නාමයෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගේ නාමයෙන් ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය වෙත තැන්පත් කර ඇති යම් මුදල් ප්‍රමාණයක් මත 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ගෙවිය යුතු පොලියෙන් සියයට විස්සක් වූ අනුප්‍රමාණයක් ආදායම් බදු අඩු කරනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ අඩු කිරීමක කාර්ය සඳහා "පොලිය" යන්නෙන් යම් තක්සේරු වර්ෂයක දී ආදායම් බද්දෙන් නිදහස් කරනු නොලැබුවා වූ හෝ ඒ සම්බන්ධයෙන් 81 වන වගන්තිය යටතේ අඩු කිරීමක් කරනු නොලැබුවා වූ ආදායම් බදු අය කරනු ලැබිය යුතු තැනැත්තකුට බැංකුවකින් හෝ මූල්‍ය ආයතනයකින් ලැබුණු පොලියේ ඒ කොටස අදහස් වේ.

(2) මේ පනත යටතේ ආදායම් බදු අය කරනු ලැබිය යුතු තැනැත්තකුට යම් තක්සේරු වර්ෂයකදී යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවනු ලබන යම් පොලියකින් (1) වන උපවගන්තියේ විධිවිධානවලට

අනුකූලව ආදයම් බදු අඩු කරන ඒ සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින්, පහත සඳහන් විස්තර දක්වෙන ප්‍රකාශයක් ඒ තැනැත්තාට නිකුත් කරනු ලැබිය යුතු ය :—

(අ) ඒ තක්සේරු වර්ෂයේ දී ලැබිය යුතු පොලියේ දළ මුදල් ප්‍රමාණය ;

(ආ) අඩු කරන ලද අනුප්‍රමාණය සහ බදු මුදල සහ එය අඩු කරනු ලැබුවේ යම් කාලයක් සඳහා ද, ඒ කාලය ; සහ

(ඇ) සැබවින් ම ගෙවනු ලබන ශුද්ධ පොලී ප්‍රමාණය.

අඩු කරනු ලැබූ බදු වෙනුවෙන් බැර.

113ආ. යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදයමෙහි 113අ වගන්තියෙහි සඳහන් ගෙවීමක් ඇතුළත් වන අවස්ථාවක, එවිට—

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදයම් බද්ද, 113අ වගන්තිය යටතේ කරන ලද මුළු අඩු කිරීම් ඉක්මවන්නේ නම්, ඒ වගන්තියට අනුකූලව කරන ලද ඒ ගෙවීමට අදාළ ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ ප්‍රකාශයෙහි දක්වා ඇති බදු මුදල, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදයම් බද්දෙන් අඩුකර ගැනීමට ඔහු හිමිකම් ලැබිය යුතු ය ;

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදයම් බද්ද, 113අ වගන්තිය යටතේ කරන ලද මුළු අඩුකිරීම්වලට අඩු වන්නේ නම්, ඒ වගන්තියට අනුකූලව, සහ XXIII වන පරිච්ඡේදයේ විධි විධානවලට යටත්ව කරන ලද, ඒ ගෙවීමට අදාළ ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු ආදයම් බද්ද සහ ඒ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් අතර වෙනසෙහි මුදල ආපසු ගෙවනු ලැබීමට ඔහු හිමිකම් ලැබිය යුතු ය.

113ඇ. (1) 113අ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ආදයම් බදු අඩු කරනු ලැබිය හැක්කේ යම් තැනැත්තකුගේ පොලියෙන් ද ඒ තැනැත්තා විසින්, යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ආදයම් බදු ප්‍රමාණය, 113අ වගන්තිය යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා අඩු කළ හැකි ආදයම් බද්දට වඩා අඩු නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ආදයම් බද්ද අඩු කිරීමෙහි ලා අවශ්‍ය අනුකූලනය කිරීම් කළ යුතු බවට ඒ බැංකුවට හෝ මූල්‍ය ආයතනයට විධානයක් නිකුත් කරන ලෙස, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියක් අනුව සහ එසේ නියම කරනු ලබන යම් විස්තර ඇතුළත් ඉල්ලීමක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ කල්හි, (ඉල්ලුම්කරුට පිටපතක් නිකුත් කරනු ලැබිය යුතු) ලියවිල්ලකින් වූ අවශ්‍ය විධානයක්, ඒ ඉල්ලීමෙහි සඳහන් බැංකුවට හෝ මූල්‍ය ආයතනයට කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ කළ හැකි අතර, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින්, ඒ විධානයට අනුකූලව, ඒ තැනැත්තාට ගෙවිය යුතු පොලියෙන් ආදයම් බද්ද අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුවද නිකුත් කරන ලද යම් විධානයක් කවර හෝ අවස්ථාවක වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ විධානය නිකුත් කළ දිනට ඉක්බිතිව දින තිහක කාලයක් ඇතුළත අභියාචනයෙහි හේතු සැකෙවින් දක්වමින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනය කළ හැකි ය. එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය :

එසේ වුව ද, ඒ තැනැත්තා විසින්, කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් මත, ඒ තක්සේරුවට විරුද්ධව 117 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වීම සඳහා කොමසාරිස් ජනරාල්-වරයා විසින් 115 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා තක්සේරුවක් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(4) සෑම බැංකුවක් සහ මූල්‍ය ආයතනයක් විසින් ම:—

(අ) මේ පනත යටතේ ආදායම් බදු අයකළ යුතු තැනැත්තන්ට තක්සේරු වර්ෂයක දී එය විසින් ගෙවන ලද පොලිය සහ ඒ පොලිය ගෙවන ලද දිනය හෝ දින සම්බන්ධයෙන් නිසි වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ආකාරයකින් තබා ගනු ලැබිය යුතු ය ; තවද

(ආ) එය විසින් පවත්වා ගෙන යනු ලබන හා (ආ) ඡේදයෙහි සඳහන් යම් වාර්තාවක් පරීක්ෂා කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකුට අවසර දිය යුතුය.

113ඈ. මේ පනත යටතේ ආදායම් බදු අයකළ යුතු තැනැත්තන්ට යම් තක්සේරු වර්ෂයක දී යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවනු ලබන පොලියෙන් ආදායම් බදු අඩු කිරීමට නියම කරනු ලැබ ඇති ඒ සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ම, ඒ ගෙවීම සම්බන්ධයෙන් ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය සහ ඒ තැනැත්තා අතර ඇතුළත් වූ යම් ගිවිසුම-කට අනුකූලව ඒ තැනැත්තාට ඒ පොලිය ගෙවනු ලබන අවස්ථාවේ දී ඒ ආදායම් බද්ද අඩු කළ යුතු ය. තව ද ඒ අඩු කිරීම කරනු ලැබූවේ යම් මාසයක දී ද ඒ මාසයට පසුව එළඹෙන මාසයේ පහළොස් වන දිනට පෙර, එසේ අඩු කර ගන්නා ලද මුදල කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කළ යුතු ය. තවද, ඒ අවස්ථාවේ දී ම කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියක් අනුව සහ එසේ නියම කරනු ලබන ආකාරයකින් වූ ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය.

113ඉ. (1) 113ඈ වගන්තියට අනුකූලව මේ පනත යටතේ ආදායම් බදු අයකළ යුතු තැනැත්තකුට යම් තක්සේරු වර්ෂයක දී යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩු කිරීම ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, හෝ එසේ අඩු කරනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත

ප්‍රේෂණය කිරීම බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, මේ වගන්තියේ විධිවිධාන යටතේ අඩු කිරීමට එයට නියම කරන ලද මුත් එසේ අඩු නොකරන ලද සම්පූර්ණ බද්දේ ප්‍රමාණයට නැතහොත්, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු නොලැබූ අඩු කරන ලද සම්පූර්ණ බද්දේ ප්‍රමාණයට හෝ එහි කොටසට ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය වගකිව යුතු ය. තව ද, අවස්ථාවෝචිත පරිදි, අඩු කරනු නොලැබූ හෝ අඩු කරනු ලැබ ප්‍රේෂණය කරනු නොලැබූ මුදල් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු වූයේ යම් දිනයක හෝ ඉන් පෙර ද, ඒ දිනයට ඉක්බිති දිනයෙහි සිට ඒ මුදල පැහැර හැර තිබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද මේ පනතින් විධිවිධාන සලසා ඇති ආකාරයෙන් ඒ මුදල් ඒ බැංකුවෙන් හෝ මූල්‍ය ආයතනයෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක්වුව ද, යම් තැනැත්තකුට ගෙවන ලද පොලියෙන් අඩු කිරීමට බැංකුව විසින් හෝ මූල්‍ය ආයතනය විසින් හෝ පැහැර හරිනු ලැබ ඇත්තා වූ ආදායම් බද්දේ මුදල හෝ එහි යම් කොටසක් හෝ අඩු කරනු ලැබිය යුතු වූයේ යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තාගෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ මුදල හෝ ඒ කොටස අයකර ගනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ආදායම් බදු මුදල සම්පූර්ණයෙන් ම බැංකුවෙන් හෝ මූල්‍ය ආයතනයෙන් නැතහොත් ඒ අඩුකිරීම කරනු ලැබිය යුතු වූයේ යම් තැනැත්තකුගෙන් ද, සම්පූර්ණයෙන් ම ඒ තැනැත්තාගෙන් නැතහොත් බැංකුවෙහි හෝ මූල්‍ය ආයතනයෙන් කොටසක් සහ ඒ තැනැත්තාගෙන් කොටසක් ද අයකර ගැනීම පිණිස සුදුසු යයි තමා සිතන යම් පියවර ගැනීමෙන් කොමසාරිස් ජනරාල්වරයා වළක්වන්නේ යයි මේ වගන්තියේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

113ඊ. මේ පනත යටතේ ආදායම් බදු අයකළ හැකි යම් තැනැත්තකුට යම් තක්සේරු වර්ෂයක් දී ගෙවන ලද පොලියෙන් ආදායම් බද්ද අඩු කිරීමට නියම කරනු ලැබ සිටින යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින්—

(අ) මේ පරිච්ඡේදය යටතේ අඩු කිරීමට ඊට නියම කර ඇති සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක් හෝ අඩු කිරීමට පැහැර හරින;

(ආ) එසේ අඩු කරන ලද සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක් හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට පැහැර හරින ; හෝ

(ඇ) 113ඇ වගන්තිය යටතේ යම් ප්‍රකාශයක් සැපයීමට පැහැර හරින

අවස්ථාවක, තක්සේරුකරුවකු විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් අඩුකොට කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළයුතු වූ ආදායම් බදු මුදල හෝ අතිරේක ආදායම් බදු මුදල ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත යම් අවස්ථාවක දී තක්සේරු කරනු ලැබිය හැකි අතර 113ඌ වගන්තිය යටතේ අයවීමට

තිබිය හැකි යම් මුදලක් සමග ඒ මුදල වහාම ගෙවන ලෙය ඒ තක්සේරුකරු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ බැංකුවට හෝ මූල්‍ය ආයතනයට නියම කළ යුතු ය.

113උ. (1) 113ඊ වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද යම් තක්සේරුවක ප්‍රමාණය ගැන අතෘප්තියට පත් වූ යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින්, ඒ තක්සේරු කිරීමේ දැන්වීමෙහි දිනයෙන් පසු, දින තිහක කාල සීමාවක් ඇතුළත, ඒ තක්සේරු කිරීමට විරුද්ධව කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනය කළ හැකි ය :

එසේ වුව ද ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, අසනීපවීම හෝ වෙනත් සාධාරණ හේතුවක් නිසා ඒ කාලසීමාව ඇතුළත අභියාචනය කිරීමෙන් අභියාචක වළක්වනු ලැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වූවහොත්, අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කාලය දීර්ඝ කිරීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අභියාචනය ඉදිරිපත් කොට ඇත්තේ යම් තක්සේරුවකට විරුද්ධව ද ඒ තක්සේරුව 113ඇ වගන්තිය යටතේ සැපයීමට නියමිත ප්‍රකාශනයක් නොමැතිව ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, අභියාචනා පෙත්සම ඒ ප්‍රකාශනය සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) 113ඊ වගන්තිය යටතේ කරන ලද තක්සේරු කිරීමක් මගින් අය කර ඇති ආදයම් බදු මුදල, ඒ තක්සේරු කිරීමට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර තිබුණ ද බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ගෙවනු ලැබිය යුතු ය.

(4) 117(5) වන වගන්තියේ සිට 122 වන වගන්තිය තෙක් වූ වගන්තිවල විධිවිධාන, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයක් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(5) මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව කරන ලද තක්සේරු කිරීමකට විරුද්ධව (1) වන උපවගන්තියෙහි සඳහන් කාල සීමාව ඇතුළත වලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, නැතහොත් තක්සේරු කිරීමක් සම්බන්ධයෙන් 117(5) වන වගන්තිය යටතේ ගිවිසුමකට එළඹෙන අවස්ථාවක, නැතහොත් අභියාචනයක දී තක්සේරු කිරීමක් නිශ්චය කර ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, කරන ලද හෝ ගිවිසගනු ලැබූ හෝ අභියාචනයේ දී නිශ්චය කර ඇති තක්සේරු කිරීම් මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

113ළ. මේ වගන්තියේ විධිවිධාන යටතේ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවිය යුතු ආදයම් බදු කිසිවක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින්, ඒ බද්දට අතිරේකව—

(අ) ඒ බද්දෙන් සියයට දහයකට සමාන මුදලක දණ්ඩනයක් ; සහ

(ආ) ඒ බද්ද ගෙවීම පැහැර හැරීම ආරම්භ වූ පසු මාස හයක් ඉකුත් වීමට පෙර ඒ බද්ද ගෙවා නොමැති අවස්ථාවක, ඒ බද්දෙන් සියයට පහළොවකට සමාන මුදලක වැඩිදුර දණ්ඩනයක්

ගෙවනු ලැබිය යුතු ය :.

එසේ වුවද ගෙවීම පැහැර හැරීම තමාට පාලනය කළ නොහැකි කරුණු නිසා සිදු වී යයි ද ගෙවීම පැහැර හැර ඇති බදු මුදල තමා විසින් ගෙවනු ලැබ ඇතැයි ද, ඒ ගෙවීම කරන ලද අවස්ථාවේ දී සැපයීමට නියමිත ප්‍රකාශනය තමා විසින් සපයනු ලැබ ඇතැයි ද කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඒ පැහැර හරින්නා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, පැහැර හරින්නා විසින් තැබිය යුතු යම් දණ්ඩනයක මුදල අත්හැරීම හෝ අඩු කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ හැකි ය.

113එ. මේ පරිච්ඡේදයෙහි '' මූල්‍ය ආයතනය '' යන්නෙන්, තැන්පතු මගින් මුදල් භාර ගැනීමේ හා ඒ මත පොලිය ගෙවීමේ තම ව්‍යාපාරය හෝ ඒ ව්‍යාපාරයේ කොටසක් සමන්විත වන සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ අදහස් වේ.''.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියේ (5) වන උපවගන්තියේ ''62 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව'' යන වචනවල සිට ''කිසිම තක්සේරුවක් නොකළ යුතු ය :'' යන වචන දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (5) 62 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් තක්සේරු වර්ෂයක අවසානයේ සිට වර්ෂ තුනක් ඉකුත්වීමෙන් පසුව—

(අ) (i) යම් තැනැත්තකු විසින්, 1986 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද හෝ ධන බද්ද සම්බන්ධයෙන් , හෝ

(ii) යම් තක්සේරු වර්ෂයක දී එහෙත් 1985 නොවැම්බර් මස 13 වන දිනට පෙර යම් තැනැත්තකු විසින් කරන ලද යම් ත්‍යාගයක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් මේ පනත යටතේ ගෙවිය යුතු සහ ඒ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන ඊළඟ නොවැම්බර් මාසයේ තිස්වන දින හෝ ඊට පෙර ඔහු විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක ඔහු විසින් ඇතුළත් කරනු ලැබූ යම් ත්‍යාග බද්දක් සම්බන්ධයෙන්

කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය : තවද

(ආ) යම් තක්සේරු වර්ෂයක අවසානයේ සිට වර්ෂ තුනක් ඉකුත් වීමෙන් පසුව අවස්ථාවෝචිත පරිදි ඒ තක්සේරු වර්ෂය අවසානයෙන් පසුව එළඹෙන ඊළඟ නොවැම්බර් මාසයේ තිස්වන දින හෝ ඉන් පෙර තම ආදායම හෝ ධනය සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබුවා වූ යම් තැනැත්තකු විසින්, 1986 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු අවස්ථාවෝචිත පරිදි, ආදායම් බද්ද හෝ ධන බද්ද සම්බන්ධයෙන්

කිසිම තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය :''.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තියේ (3) වන උපවගන්තියේ '' අවසානාත්මක විය යුතු ය,'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' අවසානාත්මක විය යුතු ය :

එසේ වුවද රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යුක්තිසහගත හේතුවක් නිසා (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත අභියාචනය කිරීමෙන් පැහැර හරින්නා වළක්වනු ලැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා කාලය දීර්ඝ කිරීමක් ඔහු විසින් දෙනු ලැබිය යුතු ය.''.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (ඉ) මේ උපවගන්තියෙහි '' චංචල දේපළ '' යන යෙදුමෙහි කර්මාන්ත ශාලාවක බිමට සවි කරන ලද යම් පිරියතක් හෝ යන්ත්‍රයක් ඇතුළත් වේ.''.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපලේඛනයෙහි IIආ කොටසෙහි '' 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා '' යන යෙදුම වෙනුවට '' 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපලේඛනයෙහි IIආ කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

**II ඇ කොටස**

1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

| | | |
|---|---|---|
| බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන රු. 21,000 සම්බන්ධයෙන් | ... | සියයට 10 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 24,000 සම්බන්ධයෙන් | ... | සියයට 20 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 24,000 සම්බන්ධයෙන් | ... | සියයට 30 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 24,000 සම්බන්ධයෙන් | ... | සියයට 40 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් | ... | සියයට 50'' |

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපලේඛනයේ (1) වන විෂයය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :—

**''1. ඒකාබද්ධ හින්දු පවුල්—**

1979 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හය සඳහා—

| | | බදු අනුප්‍රමාණය |
|---|---|---|
| බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන රු. 25,000 සම්බන්ධයෙන් | ... | සියයට 30 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් | ... | සියයට 40 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් | ... | සියයට 50 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් | ... | සියයට 60 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස් සම්බන්ධයෙන් | ... | සියයට 70 |

1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

| | | බදු අනුප්‍රමාණය |
|---|---|---|
| බදු අයකළ හැකි ආදායමෙහි පළමුවන රු. 25,000 සම්බන්ධයෙන් | ... | සියයට 30 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් | ... | සියයට 40 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් | ... | සියයට 50 '' තවද |

(2) ඒ උපලේඛනයෙහි 4 වන විෂයය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :—

"4. (අන්තිම කැමති පත්‍ර යටතේ භාරකරුවන් ඇතුළුව) භාරකරුවෝ :—

1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හය සඳහා—

| | | |
|---|---|---|
| (අ) භාරය 1978 නොවැම්බර් මස 15 වන දිනට පෙර පිහිටුවනු ලැබූ අවස්ථාවක | ... | සියයට 50 |
| (ආ) භාරය 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව පිහිටුවනු ලැබූ අවස්ථාවක | ... | සියයට 55 |
| 1986 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියලු භාරකරුවන් සම්බන්ධයෙන් | ... | සියයට 50." |

(3) ඒ උපලේඛනයේ 11 වන විෂයය ඉවත් කොට, ඒ වෙනුවට පහත දක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :—

"11. 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව සතු කරනු ලැබූ වෙළෙඳ ව්‍යාපාර.

| | | |
|---|---|---|
| (අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සහ ඒ එක් තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන වර්ෂ හයේ එක් එක් වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම මත | ... | සියයට 50 |

(ආ) 1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

| | | |
|---|---|---|
| (i) බදු අය කළ හැකි ආදායම මත ... | ... | සියයට 50 |
| (ii) (i) වන ඡේදය යටතේ ගෙවිය යුතු බද්ද ඉන් ඉවු කිරීමෙන් පසුව ලාභවල ඉතිරි කොටස මත | ... | සියයට 25.". |